# ශ්‍රී ලංකාවේ දරිද්‍රතාව පිටුදැකීමේ දී සුළු හා මධ්‍ය පරිමාණ ව්‍යවසායන්හි කාර්යයභාරය, විභවතා සහ ගැටලු පිළිබඳ විමර්ශනාත්මක අධ්‍යයනයක්

**සරත් එච්.කේ., අතපත්තු ඩී. සහ සුමනරත්න බී.එම්.**

ආර්ථික විද්‍යා අධ්‍යනාංශය, රුහුණ විශ්වවිද්‍යාලය

**විද්‍යුත් තැපැල**: katuku@econ.ruh.ac.lk

**සාර සංක්ෂේපය**

ගෝලීය සංවර්ධන අරමුණු අතර දරිද්‍රතාව පිටුදැකීම යන අරමුණට සුවිශේෂී වැදගත්කමක් හිමිවේ. තිරසර සංවර්ධනය සඳහා පවතින ප්‍රධානතම බාධකයක් ලෙස දරිද්‍රතාව හඳුනාගෙන ඇත.සමස්ත දරිද්‍රතාව පිටුදැකීමේ දී අත්කර ගෙන ඇති ප්‍රගතිය ආර්ථික හා සමාජීය දෘෂ්ටිකෝණයෙන් අතිශය ප්‍රසංශනීය වුව ද සියලු ආකාරයේ දිළිඳු බව සියලු තැන්හිම දුරුකිරීම යන අභියෝගයට ශ්‍රී ලංකාව මුහුණ පා සිටී. ශ්‍රී ලංකාවේ දරිද්‍රතාව ග්‍රාමීයව සංකේන්ද්‍රණය වී පවතින නිසා දරිද්‍රතාවයේ ප්‍රාදේශීය විෂමතා අඩු කිරීම සඳහා ගොවිපල නොවන (Non-farm) හෙවත් සුළු හා මධ්‍ය පරිමාණ ව්‍යවසායන්ට කළ හැකි කාර්යභාරය අතිමහත් ය. මෙම අධ්‍යයනයේ මූලික අරමුණ වන්නේ ශ්‍රී ලංකාවේ දරිද්‍රතාව පිටුදැකීම සම්බන්ධව සුළු හා මධ්‍ය පරිමාණ ව්‍යවසායක අංශයේ කාර්යභාරය, විභවතා සහ එම අංශයේ තිරසර ක්‍රියාකාරීත්වයට එරෙහිව පවතින ගැටලු පිළිබඳව විමර්ශනාත්මකව අධ්‍යයනය කිරීමය. මෙම අධ්‍යයනය සඳහා ගැඹුරු විශ්ලේෂණ ක්‍රමවේද (Indepth Analysis) යොදා ගැනේ. ප්‍රමාණාත්මක හා ගුණාත්මක විශ්ලේෂණ විධි ක්‍රම සංයෝජිත විමර්ශනාත්මක අධ්‍යයනයක් (Review Study) ඒ සඳහා පදනම් වේ. මෙම අධ්‍යයනයට අනුව ශ්‍රී ලංකාවේ සුළු හා මධ්‍ය පරිමාණ ව්‍යවසායක අංශය පදනම් කරගෙන ශ්‍රී ලංකා දරිද්‍රතා ව්‍යාප්තිය පවතින ප්‍රාදේශීය අසමානතා පිටුදැකීමට විශාල අවකාශ පවතින බව තහවුරු වේ. දේශීය ආර්ථිකයට අනන්‍ය වූ හැඩහුරුකමින් යුතු සුළු හා මධ්‍ය පරිමාණ ව්‍යවසායන් අවම ප්‍රාග්ධනයන් මත ස්ථාපිත කළ හැකි අතර බහුතරයක් වන අඩු ආදායම්ලාභී ජන කොටස්වල පරිභෝජනයට අවශ්‍ය භාණ්ඩ හා සේවා නිෂ්පාදනය ශ්‍රම සූක්ෂම නිෂ්පාදන මාදිලි හරහා සිදු කළ හැකිය. ලංකාවේ දරිද්‍රතාව පිටුදැකීමේ දී ග්‍රාමීය අංශයේ පුළුල් පරිවර්තනයක් (Inclusive Rural Poverty Transformation) ඉලක්ක වූ ග්‍රාමීය සංවර්ධන උපායමාර්ගයක් වශයෙන් සුළු හා මධ්‍ය පරිමාණ ව්‍යවසායන්හි විශේෂිකරණයක් හා විවිධාංගීකරණයක් ගොඩ නැගෙන පරිදි ප්‍රතිපත්ති සකස් කිරීම කෙරෙහි රජයේ වැඩි අවධානයන් යොමු විය යුතුය. ශ්‍රී ලංකාව විෂයෙහි "සියලු ආකාරයේ

දිළිඳුබව සියලු තැන්හිම දුරුකිරීම" යන කේන්ද්‍රිය තිරසර සංවර්ධන අභිමතාර්ථය අපේක්ෂිත කාල වකවානු වල දී සාධනය කර ගැනීමට එමගින් මහඟු පිටුවහලක් සැපයෙනු ඇත.

**ප්‍රමුඛ පද :** තිරසර සංවර්ධන අභිමතාර්ථ, දරිද්‍රතාව, විභවතා, සුළු හා මධ්‍ය පරිමාණ ව්‍යවසායක අංශය.

**හැඳින්වීම**

ගෝලීය සංවර්ධන අරමුණු අතර දරිද්‍රතාව පිටුදැකීම යන අරමුණට සුවිශේෂ වැදගත්කමක් හිමිවේ. එක්සත් ජාතීන්ගේ සංවිධානය විසින් 2015 සැප්තැම්බර් මාසයේ දී ප්‍රකාශයට පත් කරන ලද තිරසර සංවර්ධන අභිමතාර්ථ (Sustainable Development Goals) යටතේ වර්ෂ 2030 වන විට සපුරා ගත යුතු අභිමතාර්ථ 17 ක් හා ඊට බද්ධ වූ ඉලක්ක 169 ක් ඉදිරිපත් කර ඇත (ශ්‍රී ලංකා මහ බැංකුව, 2015). දරිද්‍රතාව පිටුදැකීම, පෘථිවිය ආරක්ෂා කර ගැනීම සහ සැමට සෞභාග්‍යය ළඟා කර දීම අන්තර්ගත වූ ක්‍රියාකාරී සැලැස්මක් යටතේ මෙම තිරසර සංවර්ධන අරමුණු ව්‍යුහය සකස් වී ඇත. තිරසර සංවර්ධනය සඳහා පවතින ප්‍රධානතම බාධකයක් ලෙස දරිද්‍රතාව හඳුනාගෙන ඇත. යම් රටක සියලු ආකාරයේ දිළිඳු බව, සියලු තැන්හිම දුරු කිරීම (End Poverty in all its forms everywhere) යන කේන්ද්‍රිය අභිමතාර්ථය වටා සියලු තිරසර සංවර්ධන අභිමතාර්ථ සංකේන්ද්‍රණය වී ඇත. තිරසර සංවර්ධන අභිමතාර්ථවලට සමගාමීව ලෝක බැංකුව විසින් ද වර්ෂ 2030 වන විට ගෝලීය මට්ටමින් ළඟා කර ගත යුතු අරමුණු ද්විත්වයක් (Twin Goals) අවධාරණය කොට ඇත (World Bank, 2015). අන්ත දරිද්‍රතාව පිටුදැකීම සහ සෞභාග්‍යය බෙදා හැරීම (Shared Prosperity) යනු එම අරමුණු දෙකයි. 2030 වනවිට අන්ත දරිද්‍රතාව ජාත්‍යන්තර දරිද්‍රතා ඉමට අනුව සියයට 3 දක්වා පහත හෙළීම සහ පහළම ආදායම් ලබන සියයට 40 කගේ ජීවන තත්ත්වය ඉහළ නැංවීමට අවශ්‍ය පියවර ගැනීම සෞභාග්‍යය බෙදාහැරීම යටතේ අපේක්ෂිතය.

යම් රටක සංවර්ධන ගමන් මගෙහි යහපත් ප්‍රගමනය නිරූපණය කෙරෙන එක් ප්‍රධාන පැතිකඩක් වන්නේ එරට දිළිඳු ජනගහනයේ ප්‍රමාණාත්මක විචලනයයි. එමගින් යම් රටක ජීවත් වන පුද්ගලයින්ගේ ජීවන තත්ත්වයේ ඇතිවන ප්‍රමාණාත්මක මෙන්ම ගුණාත්මක අභිගමනයන් පිළිබඳ අවබෝධයක් ලබා ගත හැකි වේ. ඕනෑම රටක සංවර්ධනය සාක්ෂාත් කර ගැනීමේදී දරිද්‍රතාව පිටු දැකීම යන්න අත්‍යවශ්‍ය අවශ්‍යතාවක් ලෙස සලකන්නේ එබැවිනි. ශ්‍රී ලංකාව ද මෙම අභිමතාර්ථ සාධනය කර ගැනීම උදෙසා කටයුතු කරමින් සිටී.

නිදහසින් පසු බලයට පත් වූ විවිධ රජයන් ශ්‍රී ලංකාවේ දරිද්‍රතාව පිටුදැකීම සඳහා විවිධ

වැඩසටහන් ක්‍රියාත්මක කොට ඇත. සමස්ත දරිද්‍රතා මට්ටමේ සාධනීය ප්‍රතිඵල සඳහා මෙම මඟපෙන්වීම් දායක වී ඇති බව ජනගහන දරිද්‍රතා දර්ශකයේ සැලකිය යුතු පහළ යාම මගින් සනාථ කෙරේ. 1990/91 දී සියයට 26.1 ක් වූ ජනගහන දරිද්‍රතා දර්ශකය 2016 වන විට සියයට 4.1 දක්වා සියයට 61 කින් පමණ දරිද්‍රතාවයේ පහත වැටීමක් නිරූපණය කෙරේ (Department of Census and Statistics, 2017). සමස්ත දරිද්‍රතාව පිටුදැකීමේ දී අත්කර ගෙන ඇති ප්‍රගතිය ආර්ථික හා සමාජීය දෘෂ්ටිකෝණයෙන් අතිශය ප්‍රසංශනීය වුව ද සියලු ආකාරයේ දිළිඳු බව සියලු තැන්හිම දුරුකිරීම යන අභියෝගයට ශ්‍රී ලංකාව මුහුණ පා සිටී. එනම් ශ්‍රී ලංකාවේ දරිද්‍රතා මට්ටමෙහි ප්‍රාදේශීය විෂමතා වඩාත් කැපී පෙනෙන අතර එහි දී අංශ වශයෙන්, පළාත් වශයෙන් දිස්ත්‍රික්ක වශයෙන් හා ප්‍රාදේශීය ලේකම් කොට්ඨාශ වශයෙන් දරිද්‍රතා මට්ටමෙහි සැලකිය යුතු විෂමතා පිළිබිඹු කෙරේ. මානව දරිද්‍රතා පැතිකඩ අනුව ශ්‍රී ලංකාව යහපත් තත්ත්වයක් අත්කර ගන්නා අතරම අංශමය වශයෙන් දරිද්‍රතාවයේ විෂමතා පවතින බව ග්‍රාමීය හා වතු අංශවල ඉහළ බහුමාන දරිද්‍රතා මට්ටමක් විද්‍යමාන බව බහුමාන දරිද්‍රතා දර්ශකයට අනුව පැහැදිලි වේ (Department of Census and Statistics, 2019). එනම් ග්‍රාමීය හා වතු අංශවල බහුමාන දරිද්‍රතා දර්ශකය පිළිවෙලින් 0.0085 සහ 0.0433 වශයෙනි.

ශ්‍රී ලංකාවේ නිල දරිද්‍රතා රේඛාවට ඉතා ආසන්න වශයෙන් විශාල ජනගහනයක් සංකේන්ද්‍රණය වී ඇති අතර යම් හෙයකින් නිල දරිද්‍රතා රේඛාවේ අගය සුළු ප්‍රතිශතයකින් ඉහළ ගියහොත් නැවත එම ජනගහනය අන්ත දරිද්‍රතා මට්ටමකට ඇද වැටීමට ඉහළ සම්භාවිතාවක් පැවතීම අවධානයට ලක්විය යුත්තකි. දිළිඳු ජනගහනයෙන් විශාල කොටසක් ග්‍රාමීය අංශයට ඇතුළත් වීම සහ මූලිකව ම ඔවුන්ගේ ජීවනෝපාය කෘෂිකාර්මික ක්ෂේත්‍රය හා බද්ධ වී පවතින හෙයින් ආර්ථික කම්පන හා ස්වභාවික විපත් වැනි අවදානම්කාරී තත්ත්වයන් හමුවේ තවදුරටත් පහළ දරිද්‍රතා මට්ටමකට ඇඳ වැටීමේ ඉහළ සම්භාවිතාවක් පවති (ශ්‍රී ලංකා මහ බැංකුව, 2018). ශ්‍රී ලංකාව ඇතුළුව සංවර්ධනය වෙමින් පවතින රටවල දරිද්‍රතාව මූලික වශයෙන්ම ග්‍රාමීය ප්‍රපංචයකි. ශ්‍රී ලංකාවේ දරිද්‍රතාව ග්‍රාමීයව සංකේන්ද්‍රණය වී පවතින නිසා දරිද්‍රතාවේ ප්‍රාදේශීය විෂමතා අඩු කිරීම සඳහා ගොවිපල නොවන (Non-Farm) හෙවත් සුළු හා මධ්‍ය පරිමාණ ව්‍යවසායන්ට කළ හැකි කාර්යභාරය අතිමහත් ය. ශ්‍රී ලංකාව ඇතුළුව බොහෝ සංවර්ධනය වෙමින් පවතින රටවල ක්‍රියාත්මක නව ලිබරල්වාදී ආර්ථික මෝඩලය යටතේ රාජ්‍ය අංශයේ හැකිලීම නිසා එයට අනන්‍ය වූ පදනමක් තුළ හට ගත හැකි ශුභසාධන වියදම් තාර්කීකරණය සහ නිර්මාණය විය හැකි සේවා වියුක්ති තත්ත්වයන්ට විභව විසඳුම් (Potential Solution) ලෙස සුළු හා මධ්‍ය පරිමාණ ව්‍යවසායන් සංවර්ධනය හරහා විශේෂයෙන්ම අඩු ආදායම් ලබන දරිද්‍ර ජනගහනයට උපකාරී කළ හැකිවේ.

ශ්‍රී ලංකාවේ සංවර්ධන ගමන් මඟ තුළ ඉතා වැදගත් උපාය මාර්ගික අංශයක් ලෙස සුළු හා මධ්‍ය පරිමාණ අංශය හඳුනා ගෙන ඇත. දරිද්‍රතාව සහ ආදායම් විෂමතා අවම කිරීම, සර්වග්‍රාහී ආර්ථික වෘද්ධිය සහතික කිරීම, සේවා නියුක්ති ඉඩ ප්‍රස්තා විවර වීම, කාර්මීකරණයට අවශ්‍ය පදනම ගොඩනැගීම, ඉතුරුම් සංචලනය සහ දිළිඳු ජන කොටස්වල මූලික අවශ්‍යතා සංතෘප්ත කිරීම සඳහා භාණ්ඩ හා සේවා නිෂ්පාදනය යන පුළුල් පරාසයක සංවර්ධන අරමුණු සාධනය කර ගැනීමෙහි ලා ප්‍රබල ලෙසම දායක විය හැකි විභව අංශයන් ලෙස සුළු හා මධ්‍ය පරිමාණ ව්‍යවසායක අංශය වඩාත් වැදගත් වේ. (SME Task Force, 2002; Jayasekara & Thilakarathna, 2013; Ministry of Industry and Commerce, 2016; Cook & Nixson, 2005; DFID, 2000; Grosh & Somolekae, 1996).

ශ්‍රී ලංකාවේ දරිද්‍රතාව පිටුදැකීමේ දී සුළු හා මධ්‍ය පරිමාණ අංශය කවර ආකාරයකින් වැදගත් වන්නේ ද යන්න ඒ පිළිබඳ දේශීය හා විදේශීය වශයෙන් සිදු කර ඇති පර්යේෂණ ආශ්‍රයෙන් විමර්ශනය කළ හැකිය.

සංවර්ධනය වෙමින් පවතින බොහෝ රටවල අත්දැකීම් ආශ්‍රයෙන් 1970 ගණන්වල සිට එම රටවල සුළු හා මධ්‍ය පරිමාණ ව්‍යවසායන් ආර්ථික වර්ධනය ශක්තිමත් කිරීම මගින් රටක දරිද්‍රතාව අඩු කිරීම සඳහා ප්‍රබල දායකත්වයක් සපයා ඇති බව හෙළි වී තිබේ (OECD, 2009; Olawale & Garwe, 2010).

Daniels (1999) සහ de Kok et al. (2013) දී සිදු කළ අධ්‍යයනයක් මගින් පෙන්වා දී ඇත්තේ ආදායම් ඉහළ නැංවීම සහ වේගවත් ආර්ථික වර්ධන මට්ටමක් හරහා සේවා නියුක්ති අවස්ථා ඇති කිරීම තුළින් සුළු හා මධ්‍ය පරිමාණ ව්‍යවසායන් දරිද්‍රතාව පිටුදැකීම සඳහා දායකත්වයක් සපයා ඇති බවයි.

Kobia සහ Sikalich (2010) දී පෙන්වා දී ඇත්තේ දරිද්‍රතාව පිටුදැකිමේ දී සුළු හා මධ්‍ය පරිමාණ ව්‍යවසායන්ට විශාල කාර්යභාරයක් කළ හැකි බවයි. එහිදී එම ව්‍යවසායන් ආර්ථික වර්ධනය ඉහළ නැංවීමට දායක වීම හරහා දරිද්‍රතාව පිටුදැකීමට ප්‍රබල ලෙස දායක වී ඇත.

සංවර්ධනය වෙමින් පවතින බොහෝ රටවල ආදායම් උත්පාදනය සහ රැකියා අවස්ථා බිහි කිරීමට සුළු හා මධ්‍ය පරිමාණ ව්‍යවසායන් ප්‍රබල දායකත්වයක් සපයන අතරම ආර්ථික වර්ධනය වේගවත් කොට දරිද්‍රතාව අඩුකිරීම සඳහා ගාමක බලවේගයක් ලෙස සුළු හා මධ්‍ය පරිමාණ ව්‍යවසායන් ක්‍රියාත්මක වන බව තහවුරු වී ඇත (Kowo et al., 2019; Olawale & Garwe, 2010).

Luetkenhorst (2004) දී පෙන්වා දී ඇත්තේ සුළු හා මධ්‍ය පරිමාණ ව්‍යවසායන් වඩාත් ශ්‍රම සූක්ෂම නැඹුරුවක් පවතින හෙයින් රටක සේවා නියුක්ති අවස්ථා පුළුල් කිරීමට සහ ආදායම් අසමානතා අඩු කිරීමට දායක වීම මගින් දරිද්‍රතාව පිටුදැකීමට සුළු හා මධ්‍ය පරිමාණ ව්‍යවසායන් පුළුල් දායකත්වයක් සපයා ඇති බවයි.

Nursini (2020) විසින් ඉන්දුනීසියාව ආශ්‍රයෙන් සිදු කළ අධ්‍යයනයක් මගින් පෙන්වා දී ඇත්තේ එරට සුළු හා මධ්‍ය පරිමාණ ව්‍යවසායන් සෘජුව සහ වක්‍රව එරටේ දරිද්‍රතාව අඩු කිරීම සඳහා දායක වී ඇති බවයි. විශේෂයෙන්ම සුළු හා මධ්‍ය පරිමාණ ව්‍යවසායන් ආර්ථිකයේ ශ්‍රමය අවශෝෂණය (Labor Absorption) කර ගැනීම හරහා දරිද්‍රතාව පිටුදැකීමට ප්‍රබල දායකත්වයක් සපයා ඇති බව තවදුරටත් තම අධ්‍යයනය මගින් සනාථ කර ඇත.

රැකියා අවස්ථා බිහි කිරීම සහ ජනතාවගේ ආදායම් වර්ධනය කිරීමෙන් රටක ආර්ථික වර්ධනය සහ දරිද්‍රතාව පිටුදැකීමට සුළු හා මධ්‍ය පරිමාණ ව්‍යවසායන් ඉතා වැදගත් කාර්යයභාරයක් සිදු කරන බව තවත් අධ්‍යයන කිහිපයක් මගින් තහවුරු කර ඇත (Shariff et al., 2010; Beck et al., 2005).

පොදුවේ බොහෝ අධ්‍යයන මගින් පෙන්වා දී ඇත්තේ රටක සුළු හා මධ්‍ය පරිමාණ ව්‍යවසායක අංශයේ වර්ධනය සහ ආර්ථික වර්ධනය අතර ප්‍රබල ධනාත්මක සබඳතාවක් පවතින බවත් ඒ අනුව එම අංශය දරිද්‍රතාව සමග ප්‍රතිලෝම සබඳතාවක් පවතින බවත්ය (Attanasio & Szekely, 1999; Gebremariam et al., 2004; Liedhotm et al., 1994; Sen, 1980; Green et al., 2002; Manzoor et al., 2019; Islam, 2004; Nursini & Tawakkal, 2019; Geremewe, 2018).

ශ්‍රී ලංකාවේ දරිද්‍රතාවේ ප්‍රාදේශීය විෂමතා පැවැතීම සහ නිල දරිද්‍රතා රේඛාවට ඉතා ආසන්න වශයෙන් විශාල ජනගහනයක් සංකේන්ද්‍රණය වී ඇති විටෙක එම අයහපත් තත්ත්වයන් පිටු දැකීම සඳහා මෙන්ම පුළුල් වශයෙන් සියලු ආකාරයේ දිළිඳු බව, සියලු තැන්හිම දුරුකිරීම යන අභිමතාර්ථය සාධනය කර ගැනීමෙහිලා සුළු හා මධ්‍ය පරිමාණ ව්‍යවසායක අංශයේ කාර්යභාරය හා එහි විභවතා මෙන්ම එම අරමුණු කරා ගමන් කිරීමේදී මුහුණ දීමට සිදුවන ගැටලු හා සංරෝධක මොනවාද යන්න විමර්ශනය කිරීම මෙම අධ්‍යයනය යටතේ සිදු කෙරේ.

### *ශ්‍රී ලංකාවේ දරිද්‍රතාව සහ සුළු හා මධ්‍ය පරිමාණ ව්‍යවසායන්*

පිළිගත හැකි ජීවන මට්ටමක් අත් කර ගැනීමට හේතුවන මූලික අවශ්‍යතා පිරිමසා ගැනීමට නොහැකි වීම පොදුවේ දරිද්‍රතාව ලෙස අර්ථ දැක්වේ. දරිද්‍රතා සංකල්පය ප්‍රධාන පැතිකඩ දෙකක් යටතේ අර්ථ විග්‍රහ කර ඇත.

### *ආදායම් හෙවත් පරිභෝජන දරිද්‍රතාව (Income Poverty or Consumption Poverty)*

යම් සමාජයක හෝ කුටුම්බයක හෝ මූලික අවශ්‍යතා පිරිමසා ගැනීමට ප්‍රමාණවත් ආදයම් මට්ටමක් නොමැති වීම ආදායම් දරිද්‍රතාවයි. මෙහි දී මූලික අවශ්‍යතා යටතේ අවම පරිභෝජන මට්ටමක් පවත්වා ගැනීම අදහස් කෙරෙන අතර එහිදී ආහාර සහ ආහාර නොවන පරිභෝජන වියදම් සැලකිල්ලට ගනු ලබන හෙයින් මෙය පරිභෝජන දරිද්‍රතාව ලෙසද අදහස් කෙරේ. ආර්ථිකය හෝ සමාජයක හෝ අවම ආදායම් මට්ටම හෝ පරිභෝජනය හෝ අත්කර ගත නොහැකි ජනගහනය හෝ කුටුම්බ සංඛ්‍යාව කොපමණ ද යන්න මේ යටතේ සැලකිල්ලට ගැනේ. ආදායම් දරිද්‍රතාව නැවත නිරපේක්ෂ දරිද්‍රතාව (Absolute Proverty) සහ සාපේක්ෂ දරිද්‍රතාව (Relative Poverty) වශයෙන් දෙ ආකාර වේ. යම් සමාජයක මූලික අවශ්‍යතා ඉටුකර ගැනීමට ප්‍රමාණවත් ආදායම් මට්ටමක් අත්කර ගත නොහැකි වීම නිසා හට ගන්නා දරිද්‍රතාව මිනුම් කිරීමේ දී බහුල වශයෙන්ම නිරපේක්ෂ දරිද්‍රතාව යටතේ ජනගහන දරිද්‍රතා දර්ශකය (Poverty Headcount Index) යොදා ගැනේ. ආදායම් දරිද්‍රතාවේ දෙවන පැතිකඩ වන්නේ සාපේක්ෂ දරිද්‍රතාවයි.ජනගහනයේ එක් කොටසකගේ සමාජ ආර්ථික තත්ත්වයන් සමග සසඳා බලන විට තවත් කොටසකගේ සමාජ ආර්ථික තත්ත්වයන් සාපේක්ෂ වශයෙන් දිළිඳු යයි හඳුනා ගැනීම සාපේක්ෂ දරිද්‍රතාව ලෙස අදහස් වේ.

### *මානව දරිද්‍රතාව (Human Poverty)*

නිදහස, ආත්ම ගරුත්වය හා අන්‍යයන්ගේ සැලකිල්ල භුක්ති විඳිමින් සෞඛ්‍ය සම්පන්නව හා සතුටුදායක ජීවන තත්ත්වයක් ගත කිරීම සාක්ෂාත් කර ගැනීමට අදාළ මානව සංවර්ධනය සඳහා ඇති ඉඩ ප්‍රස්තා හා තේරීම් අහිමි වී ගිය තත්ත්වයක් මානව දරිද්‍රතාව ලෙස එක්සත් ජාතීන්ගේ සංවිධානය විසින් නිර්වචනය කර තිබේ (අතපත්තු, 2018).

මෙහි දී ආදායම හෝ පරිභෝජනය යන පටු සීමාවක සිට දරිද්‍රතාව හඳුනා ගැනීමකට වඩා පුද්ගල ජීවිතයේ ගුණාත්මක තත්ත්වය සැලකිල්ලට ගෙන දරිද්‍රතාව හඳුනා ගැනීමට හා මිනුම් කිරීමට උත්සුක වී ඇත. වර්තමානයේ දී මානව දරිද්‍රතාව අර්ථ දැක්වීම හා මිනුම් කිරීම බහුමාන දරිද්‍රතාව (Multidimensional Poverty) පදනම් ව බහුමාන දරිද්‍රතා දර්ශකය

(Multidimensional Poverty Index) මගින් විමසා බැලේ.

වර්තමානයේ පහළ මැදි ආදායම් මට්ටමකට හිමිකම් කියන ශ්‍රී ලංකාව දකුණු ආසියානු කළාපයේ සංවර්ධනය වෙමින් පවතින රටකි. ශ්‍රී ලංකාවේත දරිද්‍රතාවේ හැසිරීම අධ්‍යයනය කිරීමේ දී ජනලේඛන හා සංඛ්‍යා ලේඛන දෙපාර්තමේන්තුව මගින් ප්‍රකාශයට පත්කොට ඇති ජනගහන දරිද්‍රතා දර්ශකය හා බහුමාන දරිද්‍රතා දර්ශකය උපයෝගී කර ගත හැකිය. පසුගිය දශක කිහිපය තුළ ශ්‍රී ලංකාවේ ජනගහන දරිද්‍රතා දර්ශකයේ හැසිරීම පහත 01 සංඛ්‍යා සටහන මගින් නිරූපණය කෙරේ.

***ශ්‍රී ලංකාවේ ජාතික හා අංශමය දරිද්‍රතාව***

**සංඛ්‍යා සටහන 01: ජාතික හා අංශමය මට්ටමින් ශ්‍රී ලංකාවේ දරිද්‍රතාව**

| අංශ/ වර්ෂ | 1995/96 | 2002 | 2006/07 | 2009/10 | 2012/13 | 2016 |
|---|---|---|---|---|---|---|
| ශ්‍රී ලංකාව | 28.8 | 22.7 | 15.2 | 7.6 | 6.7 | 4.1 |
| නාගරික | 14.0 | 7.9 | 6.7 | 6.5 | 2.1 | 1.9 |
| ග්‍රාමීය | 30.9 | 24.7 | 15.7 | 7.7 | 7.6 | 4.3 |
| වතු | 38.4 | 30.0 | 32.0 | 9.2 | 10.9 | 8.8 |

මූලාශ්‍රය : ජනලේඛන හා සංඛ්‍යා ලේඛන දෙපාර්තමේන්තුව, 2017

පොදුවේ 1995/96 - 2016 කාලසීමාවේ ශ්‍රී ලංකාවේ ජාතික දරිද්‍රතා මට්ටම දිගුකාලීනව පහත වැටීමේ නැඹුරුතාවක් පෙන්වා ඇත. 1990 ගණන්වල අංක දෙකක දරිද්‍රතාව වර්තමානය වන විට තනි අංකයක් දක්වා පහත වැටී ඇත. 1995/96 සාපේක්ෂව 2016 වන විට ශ්‍රී ලංකාවේ දරිද්‍රතා මට්ටම සියයට 86කින් පමණ සාපේක්ෂව පහළ වැටී ඇති බව පැහැදිලි වේ. ග්‍රාමීය සහ වතු අංශවල පැවැති ඉහළ දරිද්‍රතා දර්ශකය සාධනීය මට්ටමකින් පහළ වැටීම ඒ සඳහා දායක වී ඇත. එසේ වුව ද, නාගරික, ග්‍රාමීය සහ වතු වශයෙන් ගත් කළ ග්‍රාමීය හා වතු අංශයේ ඉහළ දරිද්‍රතා මට්ටමක් මෙන්ම එය නාගරික අංශයට වඩා කිහිප ගුණයකින් විශාල වීම ද ගැටලුවකි. 2016 දත්ත වලට අනුව ග්‍රාමීය ජනගහන දරිද්‍රතා දර්ශකය සියයට 4.3 ක් වුව ද එම අංශය සමස්ත දිළිඳු ජනගනයෙන් සියයට 82.2 කට වගකියනු ලැබේ. එනම් ග්‍රාමීය අංශයේ ජීවත්වන මුළු දරිද්‍ර ජනගහනය 693,956 කි (Department of Census and Statistics, 2017). නාගරික හා වතු අංශවල සමස්ත දරිද්‍ර ජනගහනය පිළිවෙළින් සියයට 8.0 සහ සියයට 9.8 ක් වන අතර දිළිඳු පුද්ගල සංඛ්‍යාව පිළිවෙළින් 67,649 සහ 82,308 කි. මෙම තොරතුරුවලට අනුව වතු අංශය ද ඇතුළත්ව සලකා බැලීමේ දී ශ්‍රී ලංකාවේ දරිද්‍රතාව ග්‍රාමීය ප්‍රපංචයක් බව අනාවරණය වේ. (කටුකුරුන්ද, 2006).

**ශ්‍රී ලංකාවේ පළාත්මය දරිද්‍රතාව**

පසුගිය දශක කිහිපය තුළ පළාත්මය වශයෙන් ශ්‍රී ලංකාවේ දරිද්‍රතා මට්ටමෙහි විෂමතා හඳුනා ගත හැකි අතර පහත 02 සංඛ්‍යා සටහන මගින් එය තවදුරටත් අවබෝධ කර ගත හැකි වේ.

**සංඛ්‍යා සටහන 02: ශ්‍රී ලංකාවේ පළාත්මය දරිද්‍රතාව**

| පළාත | ජනගහන දරිද්‍රතා දර්ශකය | | | | | |
|---|---|---|---|---|---|---|
| | **1995/96** | **2002** | **2006/07** | **2009/10** | **2012/13** | **2016** |
| බස්නාහිර | 16.3 | 10.8 | 8.2 | 4.2 | 2.0 | 1.7 |
| මධ්‍යම | 36.2 | 25.1 | 22.3 | 9.7 | 6.6 | 5.4 |
| දකුණ | 32.6 | 27.8 | 13.8 | 9.8 | 7.7 | 3.0 |
| උතුර | - | - | - | 12.8 | 10.9 | 7.7 |
| නැගෙනහිර | - | - | 10.8 | 14.8 | 11.0 | 7.3 |
| වයඹ | 27.7 | 27.3 | 14.6 | 11.3 | 6.0 | 2.7 |
| උතුරු මැද | 24.7 | 21.5 | 14.2 | 5.7 | 7.3 | 3.3 |
| ඌව | 46.7 | 37.2 | 27.0 | 13.7 | 15.4 | 6.5 |
| සබරගමුව | 41.7 | 33.6 | 24.2 | 10.6 | 8.8 | 6.7 |

මූලාශ්‍රය : Department of Census and Statistics, 2008, 2011, 2015, 2017

2009/10 - 2016 කාලසීමාවේ දී ඉහළ දරිද්‍රතා මට්ටමක් වාර්තා කර ඇති පළාත් වශයෙන් උතුර, නැගෙනහිර, ඌව සහ සබරමුව පළාත් හඳුනා ගත හැකි වේ. 2012/13 ට සාපේක්ෂව 2016 දී සියලුම පළාත්වල දරිද්‍රතා මට්ටම අඩු කර ගැනීමට සමත් වී ඇති ආකාරය ජනගහන දරිද්‍රතා දර්ශකය පහළ යාම මගින් නිරූපණය කෙරේ. එසේ වුව ද ග්‍රාමීය පදනමක් සහිත පළාත්වල තවමත් සාපේක්ෂව ඉහළ දරිද්‍රතා මට්ටමක් පවතින බව පැහැදිලි වේ.

***ශ්‍රී ලංකාවේ දිස්ත්‍රික්ක සහ ප්‍රාදේශීය ලේකම් කොට්ඨාශ මට්ටමින් දරිද්‍රතාව***

ශ්‍රී ලංකාවේ දරිද්‍රතාවේ ප්‍රාදේශීය ව්‍යාප්තියේ විෂමතා දිස්ත්‍රික්ක හා ප්‍රාදේශීය ලේකම් කොට්ඨාශ මට්ටමින් ද හඳුනා ගත හැකිය. 2016 දත්ත අනුව දිස්ත්‍රික් මට්ටමින් ඉහළම ජනගහන දරිද්‍රතා දර්ශකයක් වාර්තා වන්නේ කිලිනොච්චි (සියයට 18.2), මුලතිව් (සියයට 12.7), මඩකලපුව (සියයට 11.3) සහ ත්‍රිකුණාමලය (සියයට 10.0) යන දිස්ත්‍රික්කවලිනි.

එසේම 2012/13 වර්ෂයට සාපේක්ෂව 2016 දී දරිද්‍රතා මට්ටම ඉහළ ගොස් ඇති දිස්ත්‍රික්ක ලෙස කිලිනොච්චි (2012/13 - සියයට 12.7 සිට 2016 - සියයට 18.2) ත්‍රිකුණාමලය (2012/13 - සියයට 9.0 සිට 2016 - සියයට 10.0) සහ කෑගල්ල (2012/13 - සියයට 6.7 සිට 2016 - සියයට 7.1) යන දිස්ත්‍රික්ක හඳුනා ගත හැකිවේ. දිස්ත්‍රික්ක අනුව ඉහළම දිළිඳු ජනගහනය (76,429) ජීවත් වන්නේ මහනුවර දිස්ත්‍රික්කයේ ය. 2016 තොරතුරු අනුව 50,000 කට වඩා වැඩි දිළිඳු ජනගහනයන් ජීවත් වන දිස්ත්‍රික්ක ලෙස බදුල්ල, මඩකලපුව, කෑගල්ල සහ රත්නපුර කැපී පෙනේ.

ජනලේඛන හා සංඛ්‍යා ලේඛන දෙපාර්තමේන්තුව 2012/13 වර්ෂයට ප්‍රකාශ කර ඇති ශ්‍රී ලංකාවේ දරිද්‍රතාවේ අවකාශීය ව්‍යාප්තිය (Spatial Distribution of Poverty in Sri Lanka) පිළිබඳ තොරතුරු අනුව මොණරාගල දිස්ත්‍රික්කයේ සියලුම ප්‍රාදේශීය ලේකම් කොට්ඨාශ දැඩි දරිද්‍රතාවයකින් යුක්ත බව ප්‍රකාශ කර ඇත (Department of Census and Statistics, 2015a). තවද, දරිද්‍රතාවේ දැඩි භූගෝලීය අසමානතා පෙන්නුම් කරමින් ප්‍රාදේශීය ලේකම් කොට්ඨාශ සඳහා ඇස්තමේන්තු කරන ලද ජනගහන දරිද්‍රතා දර්ශකය කොළඹ දිස්ත්‍රික්කයේ දෙහිවල ප්‍රාදේශීය ලේකම් කොට්ඨාශය සඳහා සියයට 0.6 සිට මඩකලපුව දිස්ත්‍රික්කයේ මනමුනේ බටහිර (Manmunai-West) ප්‍රාදේශීය ලේකම් කොට්ඨාශයේ දරිද්‍රතා දර්ශකය සියයට 45.1 දක්වා ව්‍යාප්තිමය අසමානතාවන් හඳුනා ගත හැකි වේ. දුප්පත්ම ප්‍රාදේශීය ලේකම් කොට්ඨාශ 10 හි ඉහළ ජනගහන දරිද්‍රතා දර්ශකයක් වාර්තා කිරීම මගින් දරිද්‍රතා ව්‍යාප්තියේ පවතින දැඩි අසමානතා මනාව නිරූපණය කෙරේ.

**සංඛ්‍යා සටහන 03: ප්‍රාදේශීය ලේකම් කොට්ඨාශ අනුව දරිද්‍රතාව - 2012/13**

| ප්‍රාදේශීය ලේකම් කොට්ඨාශය | | දිස්ත්‍රික්කය | ඇස්තමේන්තුකළ ජනගහන දරිද්‍රතා දර්ශකය (%) |
|---|---|---|---|
| 1 | මනමුනේ - බටහිර | මඩකලපුව | 45.1 |
| 2 | කෝරලායි පත්තු දකුණ | මඩකලපුව | 37.7 |
| 3 | පුතුකුඩියිරිප්පු | මුලතිව් | 35.7 |
| 4 | තුනුක්කායි | මුලතිව් | 34.0 |
| 5 | මන්තායි - නැගෙනහිර | මුලතිව් | 33.7 |
| 6 | ඔඩ්ඩුසුඩාන් | මුලතිව් | 33.5 |
| 7 | මනමුනේ - නිරිත | මඩකලපුව | 28.9 |
| 8 | සියඹලාන්ඩුව | මොණරාගල | 28.7 |
| 9 | මරිට්මෙපත්තු | මුලතිව් | 28.6 |
| 10 | කෝරලායි පත්තු උතුර | මඩකලපුව | 28.0 |

මූලාශ්‍රය : Department of Census and Statistics, 2015a.

### *ශ්‍රී ලංකාවේ මානව දරිද්‍රතාව*

මානව දරිද්‍රතාව අර්ථ දැක්වීම සහ මිනුම් කිරීම බහුමාන දරිද්‍රතාව පදනම්ව සිදු කෙරේ. අධ්‍යාපනය, සෞඛ්‍යය සහ ජීවන තත්ත්වය යන පැතිකඩ තුන යටතේ දිළිඳු පුද්ගලයකු මුහුණ දෙන බහුවිධ විහීනතා (Deprivations) බහුමාන දරිද්‍රතාව මගින් පිළිබිඹු කෙරේ. ජනලේඛන සහ සංඛ්‍යාලේඛන දෙපාර්තමේන්තුව විසින් බහුමාන දරිද්‍රතාව පිළබඳ ප්‍රකාශයට පත්කර ඇති නවතම තොරතුරු පහත 04 සංඛ්‍යා සටහන මගින් දැක්වේ.

**සංඛ්‍යා සටහන 04 : ශ්‍රී ලංකාවේ බහුමාන දරිද්‍රතාව - 2016**

| අංශය | බහුමාන දරිද්‍රතා දර්ශකය | බහුමාන දරිද්‍රතාවයට පත්වීමට ආසන්න පිරිස |
|---|---|---|
| ශ්‍රී ලංකාව | 0.0089 | 0.1192 |
| නාගරික | 0.0022 | 0.0547 |
| ග්‍රාමීය | 0.0085 | 0.1276 |
| වතු | 0.0433 | 0.2242 |

මූලාශ්‍රය : Department of Census and Statistics, 2019.

නාගරික අංශයට සාපේක්ෂව ග්‍රාමීය හා වතු අංශවල ඉහළ බහුමාන දරිද්‍රතා දර්ශකයන් වාර්තා වේ. එනම් පිළිවෙළින් සියයට 0.85 සහ සියයට 4.3 වශයෙනි. එසේම බහුමාන ජනගහන දරිද්‍රතා අනුපාතය (Multidimensional Poverty Headcount Ratio) අනුව ද ග්‍රාමීය සහ වතු අංශවල අගයන් පිළිවෙළින් සියයට 2.3 සහ සියයට 11.3 කි (Department of Census and Statistics, 2019). තව ද, බහුමාන දරිද්‍රතාවට ඇද වැටීමට ආසන්න පිරිස ද (Vulnerable to Multidimensional Poor) ග්‍රාමීය සහ වතු අංශවල ඉහළ අගයන් වාර්තා කරන අතර ඒවා පිළිවෙලින් සියයට 12.8 ක් සහ සියයට 22.4 වශයෙනි. සමස්තයක් ලෙස ශ්‍රී ලංකාවේ බහුමාන දරිද්‍රතා දර්ශකය (0.009) අඩු අගයන් නිරූපණය කළ ද භූගෝලීය වශයෙන් එහි අසමානතා පවතින බව නිගමනය කළ හැකි වේ.

### *ශ්‍රී ලංකාවේ සුළු හා මධ්‍ය පරිමාණ ව්‍යවසායන් සහ එහි කාර්යභාරය*

සුළු හා මධ්‍ය පරිමාණ ව්‍යවසායන් නිර්වචනය කිරීමට වඩා එය විස්තර කිරීම පහසු බව පොදුවේ පිළිගත් මතයකි. එම නිසා සුළු හා මධ්‍ය පරිමාණ ව්‍යවසායන් නිර්වචනය පිළිබඳ පොදු එකඟතාවක් නොපවති. පොදු වශයෙන් සුළු හා මධ්‍ය පරිමාණ ව්‍යවසායන් නිර්වචනය කිරීමේ දී සේවා නියුක්තිය, වාර්ෂික පිරිවැටුම (Annual Turnover ) සහ මුළු ආයෝජනය (Total Investment) මිනුම් දඬු ලෙස භාවිත කෙරේ. කර්මාන්ත හා වාණිජ

අමාත්‍යංශය (2016) වාර්ෂික ආයෝජනය හා මුළු සේවා නියුක්තිය පදනම්ව පහත පරිදි සුළු හා මධ්‍ය පරිමාණ කර්මාන්ත නිර්වචනය කොට ඇත.

**සංඛ්‍යා සටහන 05 : සුළු හා මධ්‍ය පරිමාණ කර්මාන්ත**

| අංශය<br>**Sector** | නිර්නායක<br>**Criteria** | සුක්ෂම<br>**Micro** | කුඩා පරිමාණ<br>**Small** | මධ්‍ය පරිමාණ<br>**Medium** |
|---|---|---|---|---|
| නිමවුම් කර්මාන්ත | සේවානියුක්ත සංඛ්‍යාව | 10 හෝ 100 අඩු | 11- 50 | 51 -300 |
| | වාර්ෂික පිරිවැටුම | රුපියල් මිලියන 15 හෝ ඊට අඩු | රුපියල් මිලියන 16 - 250 | රුපියල් මිලියන 251 - 750 |
| සේවා අංශය | සේවානියුක්ති සංඛ්‍යාව | 10 හෝ 100 ට අඩු | 11 50 | 51 - 200 |
| | වාර්ෂික පිරිවැටුම | රුපියල් මිලියන 15 හෝ ඊට අඩු | රුපියල් මිලියන 16 -250 | රුපියල් මිලියන 251 750 |

මූලාශ්‍රය ; Ministry of Industry and Commerce, 2016.

2015 දී ජනලේඛන හා සංඛ්‍යාලේඛන දෙපාර්තමේන්තුව විසින් ශ්‍රී ලංකාවේ කෘෂිකාර්මික නොවන ආර්ථික කටයුතු පිළිබඳ 2013/2014 ආර්ථික සංගණනය පදනම් ව ශ්‍රි ලංකාවේ සුළු හා මධ්‍ය පරිමාණ ව්‍යවසායන් පිළිබඳ නිර්වචනය සේවා නියුක්ති සංඛ්‍යාව පදනම්ව පහත පරිදි ඉදිරිපත් කරනු ලැබ තිබේ.

**සංඛ්‍යා සටහන 06 : ශ්‍රි ලංකාවේ සුළු හා මධ්‍ය පරිමාණ ව්‍යවසායන්**

| ප්‍රධාන ආර්ථික අංශය | සේවා නියුක්ත පුද්ගලයින් සංඛ්‍යාව |
|---|---|
| කර්මාන්ත හා තැනීම් | 1 - 199 |
| වෙළෙඳාම | 1 – 34 |
| සේවා | 1 – 74 |

මූලාශ්‍රය : Department of Census and Statistics, 2015b

මෙම අධ්‍යයනය සඳහා සුළු හා මධ්‍ය පරිමාණ ව්‍යවසායන් අර්ථ විග්‍රහ කිරීමේ දී ජනලේඛන හා සංඛ්‍යාලේඛන දෙපාර්තමේන්තුව ඉදිරිපත් කර ඇති සේවා නියුක්ති සංඛ්‍යාව පදනම් කර ගන්නා ලදි.

සමාජ - ආර්ථික දෘෂ්ටිකෝණයෙන් ගත් විට සුළු හා මධ්‍ය පරිමාණ ව්‍යවසායක අංශය විසින් ශ්‍රී ලංකා ආර්ථිකය විෂයයෙහි ඉතා වැදගත් කාර්යභාරයන් සිදු කරනු ලැබේ. සේවා නියුක්ති අවස්ථා ඉහළ නැංවීම, ආදායම් ජනනය කිරීම, දරිද්‍රතාව පිටුදැකීම සහ ප්‍රාදේශීය

සංවර්ධනය යන ඒවා සම්බන්ධව වැදගත් මග පෙන්වීමක් කළ හැකි අංශයක් ලෙස සුළු හා මධ්‍ය පරිමාණ ව්‍යවසායක අංශය සැලකේ (Central Bank of Sri Lanka,1998). කෘෂිකර්මය, කැණීම්, නිමවුම් කර්මාන්ත , ගොඩනැගීම් සහ සේවා අංශය වැනි පුළුල් ආර්ථික කටයුතු සමුදායක් සුළු හා මධ්‍ය පරිමාණ අංශය මගින් ආවරණය වේ. ආයතනවලින් සියයට 90 කට වඩා සුළු හා මධ්‍ය පරිමාණ අංශයට අයත් වේ.

රටේ සේවා නියුක්තියෙන් සියයට 45 ක් පමණ දායක වන්නේ සුළු හා මධ්‍ය පරිමාණ ව්‍යවසායක අංශය යි (Ministry of Industry and Commerce, 2016).එසේම ශ්‍රී ලංකාවේ දළ දේශීය නිෂ්පාදිතයට සුළු හා මධ්‍ය පරිමාණ ව්‍යවසායන්හි දායකත්වය සියයට 50 කට වඩා වැඩි අගයක් ගනි. නිමැවුම් අංශයේ එකතු කළ අගයෙන් සියයට 30 ක් ද අපනයනවලින් සියයට 20 ක් ද සුළු හා මධ්‍ය පරිමාණ අංශවලින් දායක වේ (Asian Development Bank, 2014; MIC, 2016).

අංශමය වශයෙන් ශ්‍රී ලංකාවේ සුළු හා මධ්‍ය පරිමාණ ව්‍යවසායන්ගේ ව්‍යාප්තියේ ස්වරූපය පහත 07 සංඛ්‍යා සටහනේ දැක්වේ.

**සංඛ්‍යා සටහන 07 : අංශ අනුව ශ්‍රී ලංකාවේ සුළු හා මධ්‍ය පරිමාණ ව්‍යවසායන්ගේ ව්‍යාප්තිය – 2013/14**

| අංශය | දායකත්වය % | ආර්ථික අංශ | | |
|---|---|---|---|---|
| | | කර්මාන්ත | වෙළෙඳාම | සේවා |
| නාගරික | 24.6 | 17.4 | 26.3 | 28.0 |
| ග්‍රාමීය | 73.9 | 81.9 | 72.0 | 70.1 |
| වතු | 1.5 | 0.7 | 1.7 | 1.9 |
| ශ්‍රී ලංකාව | 100.0 | 26.0 | 41.0 | 33.0 |

මූලාශ්‍රය: Department of Census and Statistics, 2015b.

සුළු හා මධ්‍ය පරිමාණ ව්‍යවසායන්ගේ අංශමය ව්‍යාප්තිය අනුව මුළු ව්‍යවසායන්ගෙන් සියයට 74 ක් පමණ ග්‍රාමීය අංශය තුළ සංකේන්ද්‍රණය වී ඇත. ආර්ථික අංශ අනුව සැලකීමේ දී ග්‍රාමීය අංශය ඉතා වැදගත් වන අතර කර්මාන්ත, වෙළෙඳාම සහ සේවා යන අංශවල දායකත්වය පිළිවෙළින් සියයට 82 සියයට 72 සහ සියයට 70 වශයෙනි. 05 සංඛ්‍යා සටහනට අනුව සේවා සහ වෙළෙඳ අංශ අඩු හෝ වැඩි වශයෙන් නාගරික නැඹුරුවක් සහිතව ව්‍යාප්තව පවතින අතර කර්මාන්ත හා කැණීම් අංශය ග්‍රාමීය නැඹුරුවක් සහිතව ගොඩනැගී ඇත. ශ්‍රී ලංකාවේ මුළු ජනගහනයෙන් සියයට 18 ක් නාගරික අංශය නියෝජනය කරන අතර එම අංශය සුළු හා මධ්‍ය පරිමාණ ව්‍යවසායන්ගෙන් සියයට 25 කට දායක වන අතර ග්‍රාමීය අංශය මුළු ජනගහනයෙන් සියයට 77 ක් ද සමස්ත

ව්‍යවසායන්ගේ සියයට 74 කට හිමිකම් කියනු ලැබේ (Department of Census and Statistics, 2015b).

ශ්‍රී ලංකාව නිදහස ලබා ගැනීමෙන් අනතුරුව බලයට පත් වූ විවිධ රජයයන් රටේ ආර්ථික වර්ධනය, සේවා වියුක්තිය අඩු කිරීම සහ අසමානතාව හා දරිද්‍රතාව පිටු දැකීම සම්බන්ධව සුළු හා මධ්‍ය පරිමාණ ව්‍යවසායක අංශයේ දායකත්වය පිළිබඳ දැඩිව අවධාරණය කරනු ලැබ ඇත. නමුත් සුළු හා මධ්‍ය පරිමාණ ව්‍යවසායක අංශය සතු පූර්ණ සංවර්ධන විභවතා නිරාවරණය කර ගැනීමට ක්‍රියාත්මක කරන ලද ප්‍රතිපත්ති අපොහොසත් වී ඇත (Wickremasinghe, 2011).

ක්‍රියාත්මක කරන ලද බොහෝ ප්‍රතිපත්ති නාගරික පදනමක් සහිත මහා පරිමාණ ව්‍යවසායන්ට විශාල අභිනතියක් සහිතව දියත් වී ඇත. මෙම තත්ත්වය යටතේ ශ්‍රී ලංකාවේ සුළු හා මධ්‍ය පරිමාණ අංශය සතුව තවමත් නිරාවරණය නොවී පවතින විශාල විභවතා පවතින බව නිගමනය කළ හැකිවේ.

**අධ්‍යයනයේ අරමුණු**

මෙම අධ්‍යයනයේ මූලික අරමුණ වන්නේ ශ්‍රී ලංකාවේ දරිද්‍රතාව පිටුදැකීම සම්බන්ධව සුළු හා මධ්‍ය පරිමාණ ව්‍යවසායක අංශයේ කාර්යභාරය, විභවතා සහ එම අංශයේ තිරසර ක්‍රියාකාරීත්වයට එරෙහිව පවතින ගැටළු පිළිබඳව විමර්ශනාත්මකව අධ්‍යයනය කිරීමය. ඉහත මූලික අරමුණ අධ්‍යයනය කිරීම සඳහා පහත සඳහන් අරමුණු විමර්ශනාත්මකව අධ්‍යයනය කිරීමට අපේක්ෂා කෙරේ.

- ශ්‍රී ලංකාවේ දරිද්‍රතාවේ පැතිකඩ, ප්‍රමාණ සහ දරිද්‍රතා ව්‍යාප්තියේ පවතින සුවිශේෂතා විශ්ලේෂණය කිරීම.
- ශ්‍රී ලංකාවේ දරිද්‍රතාව පිටු දැකීම සම්බන්ධව සුළු හා මධ්‍ය පරිමාණ ව්‍යවසායක අංශයේ කාර්යභාරය අධ්‍යයනය කිරීම.
- ශ්‍රී ලංකාවේ දරිද්‍රතාව පිටු දැකීම සම්බන්ධව සුළු හා මධ්‍ය පරිමාණ අංශය සතු විභවතා හඳුනා ගැනීම.
- ශ්‍රී ලංකාවේ සුළු හා මධ්‍ය පරිමාණ ව්‍යවසායක අංශයේ තිරසර වර්ධනයට එරෙහිව පවතින ගැටලු අධ්‍යයනය කිරීම වශයෙනි.

**පර්යේෂණ ගැටලුව**

ශ්‍රී ලංකාවේ දරිද්‍රතාව අංශමය වශයෙන්, පළාත් වශයෙන්, දිස්ත්‍රික්ක වශයෙන් සහ ප්‍රාදේශීය ලේකම් කොට්ඨාශ මට්ටමින් ගත් විට දරිද්‍රතා ව්‍යාප්තියේ දැඩි විෂමතා නිරූපණය කරයි. ශ්‍රී ලංකාවේ දරිද්‍රතාව පිටුදැකීම සඳහා ක්‍රියාත්මක කරන ලද විවිධ ව්‍යාපෘති සහ වැඩසටහන් වල ප්‍රතිඵලයක් ලෙස සමස්ත දරිද්‍රතාවේ මෙන්ම ප්‍රාදේශීය වශයෙන් දරිද්‍රතාවේ සාධනීය අත්කර ගැනීම් සිදු වුවද අපේක්ෂිත ඉලක්ක කරා ළඟා වීමට අපොහොසත් වී ඇති බව දරිද්‍රතාව පිළිබඳ මෑතකාලීන දත්ත තවදුරටත් සාක්ෂි සපයයි. ශ්‍රී ලංකාවේ ග්‍රාමීය ජනගහන දරිද්‍රතා දර්ශකය සියයට 4.3 ක් වුව ද එම අංශය සමස්ත දිළිඳු ජනගනයෙන් සියයට 82.2 කට වගකියනු ලැබේ. එනම් ග්‍රාමීය අංශයේ ජීවත්වන මුළු දරිද්‍ර ජනගහනය 693,956 කි (Department of Census and Statistics, 2017). ශ්‍රී ලංකාවේ දරිද්‍රතාව පිටුදැකීම සඳහා දැනට ක්‍රියාත්මක මඟපෙන්වීම් සමග දේශීය අනන්‍යතාවකින් හෙබි සුළු හා මධ්‍ය පරිමාණ ව්‍යවසායක අංශයට ප්‍රාදේශීයව විෂමව ව්‍යාප්තව පවතින දරිද්‍රතාව පිටුදැකීම සඳහා කළ හැකි කාර්යභාරය කෙබඳු ද? හා ඒ සම්බන්ධව එම අංශය සතුව විභවතා පවතී ද යන්න මත මෙම අධ්‍යයනයේ පර්යේෂණ ගැටලුව ගොනුවේ. තවද, මෙම අධ්‍යයනය පහත සඳහන් පර්යේෂණ (Research Problems) ප්‍රශ්න මත ගොඩ නැගේ.

- ශ්‍රී ලංකාවේ දරිද්‍රතාවේ පැතිකඩ, ප්‍රමාණ සහ ව්‍යප්තිමය වශයෙන් පවතින සුවිශේෂතා මොනවාද?
- දරිද්‍රතාව පිටුදැකීම සම්බන්ධව සුළු හා මධ්‍ය පරිමාණ ව්‍යවසායන්ට කෙබඳු කාරයභාරයක් කළ හැකි ද?
- දරිද්‍රතාව පිටුදැකීම සම්බන්ධව සුළු හා මධ්‍ය පරිමාණ ව්‍යවසායන් සතු විභවයන් මොනවා ද?
- සුළු හා මධ්‍ය පරිමාණ ව්‍යවසායක අංශයක තිරසාර පැවැත්මට එරෙහිව පවතින ගැටලු මොනවා ද?

**පර්යේෂණ ක්‍රමවේදය**

මෙම අධ්‍යයනය සඳහා ගැඹුරු විශේලේෂණ ක්‍රමවේද (Indepth Analysis) යොදා ගැනේ. ප්‍රමාණාත්මක හා ගුණාත්මක විශ්ලේෂණ විධි ක්‍රම සංයෝජිත විමර්ශනාත්මක අධ්‍යයනයක් (Review Study) ඒ සඳහා පදනම් වේ. මෙම අධ්‍යයනය සඳහා ප්‍රාථමික දත්ත හා ද්විතීයික

දත්ත අදාළ කර ගැනේ. සුළු හා මධ්‍ය පරිමාණ ව්‍යවසායකයින් මුහුණ දෙන ගැටලු අධ්‍යයනය කිරීම සඳහා දකුණු පළාතේ සුළු හා මධ්‍ය පරිමාණ ව්‍යවසායකයන් නියැදි රාමුව ලෙස යොදා ගනිමින් බහු පියවර පොකුරු නියැදීමේ ක්‍රමය (Multistage Cluster Sampling Method) මත දකුණු පළාතේ 123,645 ක් වූ සමස්ත ව්‍යවසායකයින්ගෙන් 390 ක් අධ්‍යයන නියැදිය ලෙස තෝරා ගනු ලැබිණි. ප්‍රශ්නාවලියක් පදනම් කර ගනිමින් අදාළ තොරතුරු රැස්කරන ලදි.

ශ්‍රී ලංකාවේ දරිද්‍රතාව පිටු දැකීමේ දී සුළු හා මධ්‍ය පරිමාණ ව්‍යවසායකයින්ගේ කාර්යභාරය සහ විභවතා අධ්‍යයනය කිරීම මූලික වශයෙන්ම ද්විතීයික දත්ත මත පදනම් වේ. මෙහිදී ප්‍රධාන වශයෙන්ම පර්යේෂණ ක්ෂේත්‍රය සම්බන්ධව දැනට සිදු කර ඇති අධ්‍යයන මෙම පර්යේෂණයේ කේන්ද්‍රිය පදනම ශක්තිමත් කිරීම සඳහා දායක කර ගනු ලැබිණි. දරිද්‍රතාව පිටු දැකීමේ දී සුළු හා මධ්‍ය පරිමාණ ව්‍යවසායකයින්ගේ කාර්යභාරය පිළිබඳව ගෝලීය වශයෙන් විශාල අධ්‍යයන සංඛ්‍යාවක් සිදු කර ඇති අතර ඒ සඳහා පාදක වූ ආනුභවික නිරීක්ෂණ ප්‍රතිඵල හා සාකච්ඡා කොටසේ දී පුළුල්ව විග්‍රහ කර ඇත. සුළු හා මධ්‍ය පරිමාණ ව්‍යවසායන් දරිද්‍රතාව පිටුදැකීම සඳහා දායක විය හැකි යාන්ත්‍රණය සංවර්ධනය වෙමින් පවතින රටවල අත්දැකීම් ආශ්‍රයෙන් ශ්‍රී ලංකාවට ගළපා ගත හැකි ආකාරය එහි දී අධ්‍යයනය කෙරේ.

ශ්‍රී ලංකාවේ දරිද්‍රතාව පිටුදැකීමේ දී සුළු හා මධ්‍ය පරිමාණ ව්‍යවසායක අංශය සතු විභවතා හඳුනා ගැනීමේ දී ගෝලීය මට්ටමින් රටවල් ස්වකීය රටවල දිරිද්‍රතාව පිටුදැකීම සඳහා සුළු හා මධ්‍ය පරිමාණ ව්‍යවසායක අංශය සතුව පැවති විභවතා කවර ආකාරයකින් නිරාවරණය කර ගෙන ඇත් ද යන්න විග්‍රහ කර ඇත. ඒ පිළිබඳ බෝහෝ රටවල අත්දැකීම් සාකච්ඡා හා ප්‍රතිඵල විග්‍රහ කිරීම යටතේ දක්වා ඇත. එහි දී විශේෂයෙන්ම ඒ ඒ රටවල් පිළිබඳ සිදුකර ඇති අධ්‍යයනවල දී පාදක කර ගත් න්‍යායාත්මක රාමුව මෙන්ම එහි ප්‍රායෝගික අදාළත්වය ශ්‍රී ලංකාව පිළිබඳව සිදු කළ අධ්‍යයනයේ දී වඩාත් මඟ පෙන්වීමක් සිදු කරන ලදි

ද්විතීයික දත්ත සම්පාදනයේ දී අධ්‍යයන ක්ෂේත්‍රය පිළිබඳ ප්‍රකාශිත ප්‍රවීණයන්ගේ පර්යේෂණ පත්‍රිකා, දැනට ප්‍රකාශිත දරිද්‍රතා වාර්තා සහ සුළු පරිමාණ ව්‍යවසායකයන් පිළිබඳ තොරතුරු වාර්තා ඉතා වැදගත් විය. ජනලේඛන හා සංඛ්‍යා ලේඛන දෙපාර්තමේන්තුව, ශ්‍රී ලංකා මහ බැංකුව, ලෝක බැංකුව, එක්සත් ජාතීන්ගේ සංවර්ධන වැඩපිළිවෙළ හා ආසියානු සංවර්ධන බැංකුව විසින් ප්‍රකාශිත දත්ත හා තොරතුරු මූලාශ්‍රය මේ සඳහා වඩාත් උපකාරී විය. සංඛ්‍යා දත්ත, වගු, ප්‍රස්තාර හා අනෙකුත් සංඛ්‍යාත්මක ගණනය කිරීම් ප්‍රමාණාත්මක විශ්ලේෂණය සඳහා අදාළ කර ගනු ලැබිණි. අධ්‍යයනයේ ප්‍රතිඵල විග්‍රහ කිරිමේ දී විමර්ශණාත්මක අධ්‍යයන ක්‍රමවේදය (Review Study) අදාළ කර ගනු ලැබූ අතර

එහිදී සුළු හා මධ්‍ය පරිමාණ ව්‍යවසායකයන් දරිද්‍රතාව පිටුදැකීම සඳහා ඇති කළ බලපෑම් අන්තර්ගත න්‍යායාත්මක රාමුව හා ඊට අදාළ ආනුභවික නිරීක්ෂණ ශක්තිමත් පදනමක් සපයනු ලැබීය.

**ප්‍රතිඵල හා සාකච්ඡාව**


***ශ්‍රී ලංකාවේ දරිද්‍රතාව පිටුදැකීම සහ සුළු හා මධ්‍ය පරිමාණ ව්‍යවසායක අංශයේ කාර්යභාරය සංකල්පනාත්මක හා න්‍යායාත්මක රාමුව** (Conceptual and Theoretical Framework)*

ආර්ථිකය සුළු හා මධ්‍ය පරිමාණ ව්‍යවසායක අංශය දරිද්‍රතාව පිටුදැකීම සඳහා සම්බන්ධ වන සංකල්පනාත්මක රාමුව පහත රූප සටහන 01 මගින් නිරූපණය කෙරේ.

Agyapon (2010) අනුව සුළු හා මධ්‍ය පරිමාණ ව්‍යවසායන් ඉලක්කගත වෙළෙඳපොළ අවශ්‍යතා තෘප්තිමත් කිරීම සඳහා අවශ්‍ය කෙරෙන නව්‍ය අදහස් (Innovative Ideas) බිහි කිරීමට සමත් බව දක්වා ඇත. සුළු හා මධ්‍ය පරිමාණ ව්‍යවසායන්ගේ ක්‍රියාකාරකම් නව්‍යතා පැතිරවීමට සමත් වේ. තව ද, නව්‍යතා සහ තරගකාරීත්වය මෙහෙයවන (Drivers of Innovation and Compectition) වැදගත් අංශයක් ලෙස සුළු හා මධ්‍ය පරිමාණ ව්‍යවසායක අංශය ගැනේ.

සුළු හා මධ්‍ය පරිමාණ අංශය මගින් තම සේවා නියුක්තිය සඳහා අවශ්‍ය කෙරෙන දැනුම, නිපුණතා සහ අත්දැකීම් ලබාදීම මානව සම්පත් සංවර්ධනය (Human Resources Development) හරහා සිදුවේ. එමගින් අඩු ආදායම් ලබන දිළිඳු ජන කොටස්වල ආර්ථික ශක්තිය ගොඩනැංවීමට පදනම සැපයේ. සුළු හා මධ්‍ය පරිමාණ ව්‍යවසායක අංශයේ වර්ධනය තුළින් රැකියා පුහුණු කිරීම හරහා මානව සම්පත් සංවර්ධනයට අවශ්‍ය පසුබිම නිර්මාණය කෙරේ.

සුළු හා මධ්‍ය පරිමාණ ව්‍යවසායන්ගේ බිහිවීමෙන් ආර්ථිකයේ නුපුහුණු ශ්‍රමික කොටස් සඳහා රැකියා අවස්ථා ජනනය වේ. රැකියා බිහිකිරීම හරහා සුළු හා මධ්‍ය පරිමාණ ව්‍යවසායන් ආර්ථිකයක තිරසාරව දරිද්‍රතාව අඩු කිරීමට දායක වේ. මෙය විශේෂයෙන්ම සිදුවන්නේ එම කොටස්වල ආදායම් මට්ටම ඉහළ නැංවීමට උපකාරී වීමෙනි. පොදුවේ රටක සුළු හා මධ්‍ය පරිමාණ ව්‍යවසායන් රැකියා ජනනය කිරීම, නව්‍යතා බිහිකිරීම සහ මානව සම්පත් සංවර්ධනය හරහා ඔවුන්ගේ ආදායම් මට්ටම ඉහළ නැංවීමට උපකාරී කිරීමෙන් දරිද්‍රතාව පිටුදැකීමට දායක වන (Faki, 2014) අතරම ඉහත අංශ සෘජුවම දරිද්‍රතාව පිටුදැකීමට අවශ්‍ය පදනම සකස් කිරීමට උපකාරී වන බව රූප සටහන 01 මගින් අවබෝධ කර ගත හැකිවේ.




**රූප සටහන 01: සුළු හා මධ්‍ය පරිමාණ ව්‍යවසායන් හා දරිද්‍රතාව පිටුදැකීම පිළිබඳ සංකල්පනාත්මක රාමුව**

*මූලාශ්‍රය : Agyapong, 2010.*

රටක සුළු හා මධ්‍ය පරිමාණ ව්‍යවසායක අංශය දරිද්‍රතාව පිටුදැකීම සඳහා දායක විය හැකි ආකාරය සංකල්පනාත්මක රාමුව මගින් නිරූපණය කෙරෙන අතරම එමගින් එහි න්‍යායාත්මක රාමුව ගොඩනැගීම සඳහා අවශ්‍ය මග පෙන්වීම සිදුවේ. දරිද්‍රතාව පිටුදැකීම සඳහා දායකත්වය සපයන විචල්‍ය පිළිබඳ මග පෙන්වීම එමගින් සැපයේ. ශ්‍රී ලංකාවේ දිළිඳුකම පිටුදැකීමේ දී සුළු හා මධ්‍ය පරිමාණ ව්‍යවසායකයින්ගේ කාර්යභාරය සහ එහි විභවතා ඒ පිළිබඳ න්‍යායාත්මක රාමුව හා ආනුභවික නිරීක්ෂණ (Empirical Evidence) ආශ්‍රයෙන් විග්‍රහ කළ හැකිවේ. සුළු හා මධ්‍ය පරිමාණ ව්‍යවසායක අංශය දරිද්‍රතාව පිටුදැකීමේ දී එහි කාර්යභාරය හා විභවතා පිළිබඳ න්‍යායාත්මක රාමුව ක්ෂේත්‍ර ගණනාවක් ඔස්සේ අධ්‍යයනයට ලක්ව ඇත (Small Enterprises Assistance Funds, 2004).

### *ආර්ථික වර්ධනය ශක්තිමත් කිරීම හරහා දරිද්‍රතාව අඩු කිරීමට දායක වීම*

පෞද්ගලික අංශය රටක වර්ධන ක්‍රියාවළියට දායක කර ගැනීමේ දී සුළු හා මධ්‍ය පරිමාණ ව්‍යවසායන්ට විශාල කාර්යභාරයක් කළ හැකි අතර එමගින් ඉහළ වර්ධන ක්‍රියාවලියක් හරහා දරිද්‍රතාව පිටුදැකීමට දායක විය හැකිය. ආර්ථික වර්ධනය ශ්‍රම සූක්ෂම අංශයට අභිනතියක් දක්වන විට දරිද්‍රතාව අඩුවීම ඉහළ මට්ටමක පවතින බව නිරීක්ෂණ මගින් හෙළිකර ඇත (Loayza & Raddatz, 2010). දිළින්දන්ට හිතෛෂී ආර්ථික වර්ධන උපායමාර්ගයක ප්‍රධාන අංගයක් ලෙස සුළු හා මධ්‍ය පරිමාණ ව්‍යවසායක සංවර්ධනය සැලකේ. එවැනි වෘද්ධි ක්‍රියාවලියකට අවශ්‍ය පසුබිම ගොඩනැගීම සඳහා අවශ්‍ය පදනම සුළු හා මධ්‍ය පරිමාණ අංශය මගින් සැපයේ. පළමුව ග්‍රාමීයව ජීවත්වන බොහෝ පිරිස් අර්ධ පුහුණු හෝ නුපුහුණු ශ්‍රමිකයන් ගණයට වැටෙන අතර සුළු හා මධ්‍ය පරිමාණ

ව්‍යවසායක අංශය මගින් ජනනය කෙරෙන නව රැකියා වලින් විශාල ප්‍රමාණයක් යෝග්‍ය වන්නේ ඉහත කී පිරිස් සඳහා ය. දෙවනුව අකාර්යක්ෂම හා පසුගාමී කෘෂිකාර්මික අංශය ප්‍රතිව්‍යුහගත කිරීමට අවශ්‍ය ව්‍යාපාරික ක්‍රම, නිෂ්පාදන හා සේවා හා එම අංශයට මිත්‍රශීලී තාක්ෂණය, සුළු හා මධ්‍ය පරිමාණ ව්‍යවසායක අංශය මගින් හඳුන්වා දෙනු ලබන අතරම උපයෝජනය නොවී පවතින ශ්‍රමය ඵලදායිව නිෂ්පාදන ක්‍රියාවලියට දායක කර ගැනීමට අවශ්‍ය පදනම ද එමගින් සකස් කෙරේ. තෙවනුව පහළ ආදායම් ලබන ජන කොටස් ජාතික සංවර්ධනයට දායක කර ගැනීමට අවශ්‍ය මග පෙන්වීම සුළු හා මධ්‍ය පරිමාණ ව්‍යවසායක අංශය මගින් සැපයෙන අතරම ආර්ථික වර්ධනයේ ප්‍රතිලාභ එම අඩු ආදායම් ලබන කොටස් කරා සම්ප්‍රේෂණයට අවශ්‍ය මග පෙන්වීම ද සිදුවේ.

විවිධ රටවල් ආශ්‍රයෙන් සිදුකර ඇති අධ්‍යයනවලට අනුව සුළු හා මධ්‍ය පරිමාණ ව්‍යවසායක අංශය හා ආර්ථික වර්ධනය අතර දැඩි අනුලෝම සබඳතාවන් ද එය දරිද්‍රතාව සමග ප්‍රතිලෝම සබඳතාවන් ද පෙන්නුම් කරන බව සනාථ කර ඇත (Bowale, 2013; Liedholm et al., 1994; Mcpherson, 1996; McDade & Spring, 2005; OECD, 2009; Olawale & Garwe, 2010; Gebremariam et al., 2004; Zafar et al., 2018; Sharafat et al., 2014) පකිස්ථානය පදනම් කර ගෙන සිදු කළ අධ්‍යයනයට අනුව හෙළි වී ඇත්තේ සුළු හා මධ්‍ය පරිමාණ ව්‍යවසායන්හි නිෂ්පාදනය හේතු කොට ගෙන දරිද්‍රතාව පහත වැටී ඇති බවයි. දිළින්දන්ට හිතෛෂී ආර්ථික වෘද්ධියක් ඇති කිරීමෙහි ලා එරට සුළු හා මධ්‍ය පරිමාණ ව්‍යවසායන් ප්‍රධාන භූමිකාවක් සිදු කර ඇති බව තවදුරටත් මෙම අධ්‍යයනය මගින් තහවුරු කර ඇත. පකිස්ථානයේ ගොවිපළ නොවන ශ්‍රම බලකායෙන් (Non-Farm Labour Force) සියයට 80 ක් පමණ සුළු හා මධ්‍ය පරිමාණ ව්‍යවසායන්හි සේවා නියුක්ත කිරීම මගින් එම අංශය ආර්ථික වර්ධනයේ ප්‍රතිලාභ සියලු දෙනා අතර සමානව බෙදා හැරීමට සමත් වී ඇති බව සනාථ කර තිබේ.

Gebremariam et al. (2004) දී බටහිර වර්ජිනියාව පදනම්ව සිදු කරන ලද අධ්‍යයනයන් මගින් සනාථ කර ඇත්තේ සුළු හා මධ්‍ය පරිමාණ ව්‍යවසායන් හා ආර්ථික වර්ධනය අතර අනුලෝම සබඳතාවක් පවතින බවයි. එසේම සුළු හා මධ්‍ය පරිමාණ ව්‍යවසායන් හා දරිද්‍රතාව අතර ප්‍රතිලෝම සබඳතාවන් පවතින බව එම අධ්‍යයනය මගින් තවදුරටත් තහවුරු කර ඇත. අවසාන වශයෙන් මෙම අධ්‍යයනය මගින් සුළු හා මධ්‍ය පරිමාණ ව්‍යවසායන් ආර්ථික වර්ධනය හා දරිද්‍රතා ආපාතය අතර සම්බන්ධතාව ගොඩනගා ඇත.

නැගෙනහිර ආසියාවේ නැගී එන ආර්ථිකයන් ලෙස සැලකෙන දකුණු කොරියාව, තායිවානය, සිංගප්පූරුව හා මැලේසියාව යන රටවල මෙන්ම ASEAN කලාපයේ සුළු හා මධ්‍ය පරිමාණ ව්‍යවසායන් ආර්ථික වර්ධන ක්‍රියාවලියට ප්‍රබල දායකත්වයක් ලබා දී එම

රටවල දරිද්‍රතාව අඩු කිරීමට දායක වී ඇත (Adeyemi & Lanrewaju, 2014; Harvie, 2015). ඉහත තොරතුරු අනුව නිරීක්ෂණය වන්නේ රටක දරිද්‍රතාව පිටුදැකීමේ උපායමාර්ග අතර විශේෂයෙන්ම සුළු හා මධ්‍ය පරිමාණ ව්‍යවසායක අංශය අත්‍යවශ්‍ය ප්‍රධාන උපාංගයක් වන බව පිළිගැනීමයි (Imai et al., 2010).

### *සාපේක්ෂව අඩු නිපුණතා සහ නුපුහුණු කොටස් ඇතුළුව පහළ ආදායම් ලබන කොටස්වලට රැකියා නියුක්ති අවස්ථා විවර වීම*

අඩු නිපුණතා සහ නුපුහුණු තත්ත්වයන්ගෙන් සමන්විත ඉතා දුප්පත් ජනගහනය සඳහා යෝග්‍ය රැකියා බිහි කිරීමට සුළු හා මධ්‍ය පරිමාණ ව්‍යවසායන් සමත් වේ. Loayza and Raddatz (2010) ට අනුව නුපුහුණු ශ්‍රමය සූක්ෂමව භාවිත කිරීමෙන් සුළු හා මධ්‍ය පරිමාණ ව්‍යවසායන් දරිද්‍රතාව පිටුදැකීම සඳහා විශාල පිටුබලයක් සපයන බව දක්වා ඇත. Zafar et al. (2018) පකිස්ථානය ඇසුරින් සිදු කරන ලද අධ්‍යයනයට අනුව එරට සුළු හා මධ්‍ය පරිමාණ ව්‍යවසායන් සේවා නියුක්ති අවස්ථා ජනනය කිරීමට සමත් වී ඇති අතර එය ආර්ථිකයේ දරිද්‍රතාව පිටුදැකීම සඳහා දායක වී ඇති බව පෙන්නුම් කර තිබේ.

විශේෂයෙන්ම පකිස්ථානයේ දරිද්‍රතාව අඩු කිරීම සඳහා මානව ප්‍රාග්ධනය ඉවහල් වී ඇති බව දක්වයි. එහි දී සුළු හා මධ්‍ය පරිමාණ ව්‍යවසායන් මගින් මානව සම්පත් සංවර්ධනය ඉහළ නැංවීම නිසා පහළ දරිද්‍රතා අනුපාතයක් තීරණය වීමට හේතු වී ඇති බව හෙළි කර ඇත. ප්‍රාග්ධන සූක්ෂම පදනමක් සහිත මහා පරිමාණ ව්‍යවසායන් හා සැසඳීමේ දී සුළු හා මධ්‍ය පරිමාණ ව්‍යවසායන් ස්වභාවයෙන්ම ශ්‍රම සූක්ෂම වන නිසා රටක දරිද්‍රතාව අඩුකිරීම සඳහා එම ව්‍යවසායන්ට සඵල කාර්යභාරයක් කළ හැකි බව ඉහත අධ්‍යයනයේ දී තවදුරටත් සනාථ කර තිබේ.

සුළු හා මධ්‍ය පරිමාණ ව්‍යවසායන්හි සේවා නියුක්ත වීමෙන් උපයා ගන්නා ආදායමෙන් ඉහළ ප්‍රතිශතයක් අනෙකුත් ව්‍යවසායන්හි නිෂ්පාදිත මත වැය කිරීම හරහා පොදුවේ දරිද්‍රතාව පිටුදැකීමට අවශ්‍ය ධනාත්මක ගුණක ප්‍රතිවිපාක (Positive Multiplier Effect) නිර්මාණය කිරීමට සුළු හා මධ්‍ය පරිමාණ අංශය සමත් වේ. පහළ ප්‍රාග්ධන පදනමක් යටතේ විශාල රැකියා අවස්ථා ජනනය කිරීමට සුළු හා මධ්‍ය පරිමාණ අංශය සමත්ය. සේවා නියුක්ති අවස්ථා විවර වීමෙන් සුළු හා මධ්‍ය පරිමාණ අංශය දරිද්‍රතාව අවම කිරීම සඳහා දායක වන බව බොහෝ අධ්‍යයන සනාථ කර ඇත (Agyapong, 2010; Addi, 2014; Akugri et al., 2015; Brich, 1979; Diriba, 2013; Eramias et al., 2017; Musara & Gwaindepi, 2014; Muturi, 2015; Mukras, 2003; Sharafat et al., 2014; Villanger & Berge, 2015).

### *ශ්‍රම සූක්ෂම නිෂ්පාදනවලට එරෙහිව පවතින නැඹුරුව ඉවත් කිරීමට උපකාරී වීම*

සුළු හා මධ්‍ය පරිමාණ ව්‍යවසායන් ස්වභාවයෙන්ම ශ්‍රම සූක්ෂම වේ. ආර්ථිකයක වෙළෙඳපොළ විකෘතිතා නිසා බොහෝ සංවර්ධනය වෙමින් පවතින රටවල බහුල සාධකය වන ශ්‍රමයට එරෙහිව ප්‍රාග්ධන සූක්ෂම ක්‍රමවේද වැදගත් කොට සැලකේ. මෙම විකෘතිතාව ඉවත් කිරීම සඳහා සුළු හා මධ්‍ය පරිමාණ ව්‍යවසායන්ට හැකියාව පවතින අතරම එමගින් ආර්ථිකයේ ප්‍රගමනය උදෙසා මග පෙන්වයි.

මෙම තත්ත්වය තුළ ශ්‍රී ලංකාවේ සුළු හා මධ්‍ය පරිමාණ ව්‍යවසාය සංවර්ධනයට පමණක් නොව එම ව්‍යවසායන්ගේ සේවා නියුක්ත පිරිස්වල ජීවන තත්ත්වයන් වැඩි දියුණු කර ගැනීමට අවකාශ විවර වේ. තවදුරටත් එකිනෙකා අතර මානව සහ ප්‍රජා සංවර්ධනය වැඩි කිරීමට ද එය ඉවහල් වේ.

Manzoor et al. (2019) අනුව සුළු හා මධ්‍ය පරිමාණ ව්‍යවසායන්ට ඉතා ඉහළ මට්ටමකින් ශ්‍රමය අවශෝෂණය කර ගැනීමට හැකිවීමෙන් ආර්ථික වර්ධනය ශක්තිමත් කොට ආදායම් ප්‍රවර්ධනය මගින් දරිද්‍ර ජනගහනය අඩු කළ හැකි බව අවධාරණය කොට ඇත.

Harper (1984) පෙන්වා දී ඇත්තේ සුළු පරිමාණ ව්‍යවසායන් ප්‍රාග්ධන ඒකකයක් සඳහා ඉතා ඉහළ ශ්‍රම ඒකක ප්‍රමාණයක් භාවිත කරන බවයි. මෙම පසුබිම යටතේ නිමවුම් ඒකකයක් සඳහා අඩු ප්‍රාග්ධන ප්‍රමාණයක් අවශ්‍ය කෙරෙන හෙයින් ශ්‍රී ලංකාව වැනි සංවර්ධනය වෙමින් පවතින රටවල ග්‍රාමීයව පවතින අතිරික්ත ශ්‍රම ප්‍රමාණයන් සේවා නියුක්ත කිරීම හරහා දරිද්‍රතාව පිටුදැකීමට අවශ්‍ය යාන්ත්‍රණය සකස් කළ හැකි වේ.

### *කුඩා පරිමාණ සැපයුම්කරුවන් (ව්‍යවසායකයින්) අතර සම්බන්ධතා ගොඩනැගීමට පසුබිම නිර්මාණය වීම*

සුළු හා මධ්‍ය පරිමාණ ව්‍යවසායන් අතර සහයෝගීතාව ඇතිවීම නිසා පිරිවැය අඩුවීම, වෙළඳපොළ පිවිසුම ඉහළ යාම, නිෂ්පාදන වල ගුණාත්මක තත්ත්වය වර්ධනය වීම සහ පරිසර හිතකාමී නිෂ්පාදන ක්‍රියාවලියක් නිර්මාණය වීම යනාදී ප්‍රතිලාභ රැසක් හිමිකර ගැනීමට හැකිවේ. (UNIDO & UNDP, 2004).

මහා පරිමාණ ව්‍යවසායන්ට සාපෙක්ෂව සුළු හා මධ්‍ය පරිමාණ ව්‍යවසායන් සතුව ඉහළ සැපයුම් සම්බන්ධතා (Supply Link) පවතින නිසා ඔවුනොවුන් අතර නිෂ්පාදන හුවමාරුවෙන් ආදායම් මට්ටම ඉහළ යාමටත් එමගින් දරිද්‍රතාව පිටුදැකීමට අවශ්‍ය ශක්තිය සුළු හා මධ්‍ය පරිමාණ ව්‍යවසායන් සතුව පවතී. මෙම ක්‍රියාදාමය තුළ අවම නිෂ්පාදන පිරිවැයක් යටතේ කටයුතු කිරීමට අවකාශ සැලසෙන හෙයින් කාර්යක්ෂමව නිෂ්පාදන

කටයුතු මෙහෙයවීමට අවශ්‍ය විභවතා සුළු හා මධ්‍ය පරිමාණ ව්‍යවසායන්හි අනන්‍ය ලක්ෂණයන් බවට පත්වේ.

ශ්‍රී ලංකාව වැනි සංවර්ධනය වෙමින් පවතින රටවල කෘෂි පොහොර සහ කුඩා පරිමාණ ගොවීන් අතර සම්බන්ධතා (Agri-Business) ගොඩනැගීමෙන් සුළු හා මධ්‍ය පරිමාණ ව්‍යවසායන් ශක්තිමත් කිරීමටත් එමගින් දරිද්‍රතාව පිටුදැකීම සඳහා විශාල ජවයක් ලබාගැනීමටත් හැකියාව පවතී. (Kirsten & Sartorius, 2002).

***ඉතාමත්ම දිළිඳු ජනකොටස් කෙරෙහි අවධානය යොමුවීම හරහා දරිද්‍රතාව පිටුදැකීමට පදනම සකස් වීම***

අඩු නිපුණතාවලින් හෙබි ඉතාමත්ම දිළිඳු ජන කොටස් සුළු හා මධ්‍ය පරිමාණ ව්‍යවසායක අංශයේ කටයුතු සඳහා දායක කර ගැනීමට පුළුල් ඉඩකඩ හා අවකාශ පවති. විශේෂයෙන්ම දිළිඳු කුටුම්බවල ප්‍රධානියා කාන්තාවක් වන විට හා ඇය සුළු හා මධ්‍ය පරිමාණ ව්‍යවසායන්හි සේවා නියුක්ත වීම නිසා තම පවුල් ඒකකයේ අධ්‍යාපනය, සෞඛ්‍ය තත්ත්වය කෙරෙහි ඉහළ නැඹුරුවත් ඇතිවීමෙන් එම කුටුම්බයත් සවිබලකරණය හරහා ඉහළ ප්‍රතිලාභ හිමිකර ගැනීමට සමත් වේ (SEAF, 2004).

***බදු ගෙවීම්වලට දායකවීමෙන් දරිද්‍රතාව පිටු දැකීමට උපකාරී වීම.***

Agyapong (2010) විසින් ඝනාව ආශ්‍රයෙන් කරන ලද අධ්‍යයනයකට අනුව සුළු හා මධ්‍ය පරිමාණ ව්‍යවසායන් රජයේ බදු ආදායම ඉහළ නැංවීම සඳහා දායක වන බව හෙළිකර ඇත. මෙම ආදායම් එක් පැත්තකින් දිළිඳු ජන කොටස්වල ජන ජීවිතය ගොඩනැංවීමට අවශ්‍ය ක්ෂේත්‍ර සඳහා යොමු කිරීමට හා අනෙක් අතින් සුළු හා මධ්‍ය පරිමාණ ව්‍යවසායන් ක්‍රියාත්මක වීම සඳහා අවශ්‍ය යටිතල පහසුකම් ඇතුළු ක්ෂේත්‍ර ප්‍රවර්ධනය කිරීම සඳහා උපයෝජනය කළ හැකිය. එසේම මහා පරිමාණ ආයතන බදු පැහැර හරින තත්ත්වයක් යටතේ සුළු හා මධ්‍ය පරිමාණ ව්‍යවසායන්වලින් රැස්කර ගන්නා අරමුදල් දරිද්‍රතාව පිටුදැකීම සඳහා වන වැඩසටහන් (ප්‍රාදේශීය පොදු කාර්ය පහසුකම්, සෞඛ්‍ය සේවා, පාසල් දිවා ආහාර කටයුතු යනාදි ය) සඳහා යොදා ගැනීමට හැකියාව පවතී.

***ප්‍රජා සංවර්ධනයට ඉතා පුළුල් අවකාශ පැවැතීම***

ග්‍රාමීය ප්‍රජාවෙහිම අන්තර්ගත අංගයක් ලෙස සුළු හා මධ්‍ය පරිමාණ ව්‍යවසායන් ක්‍රියාත්මක වන නිසා එමගින් ප්‍රජා සංවර්ධනයට (Community Development) දායක වීමෙන් දරිද්‍රතාව පිටුදැකීමට එම ව්‍යවසායන්ට ප්‍රබල දායකත්වයන් ලබා දිය හැකිය. විශේෂයෙන්ම ග්‍රාමීය අඩු ආදායම් ලබන ජන කොටස් සතුව පවතින සමාජ ප්‍රාග්ධනය නිෂ්පාදන

ක්‍රියාවලිය උදෙසා දායක කර ගැනීමේ හැකියාව සුළු හා මධ්‍ය පරිමාණ ව්‍යවසායන් සතු බැවින් එය ප්‍රජාවේ අභිවෘද්ධිය උදෙසා දායක වී දරිද්‍රතාව අඩුකිරීමට උපකාරී වේ.

ග්‍රාමීය අඩු ආදායම් ලබන ජන කොටස් සතුව පවතින සමාජ ප්‍රාග්ධනය හරහා සුළු හා මධ්‍ය පරිමාණ ව්‍යවසායන්හි සාධන මට්ටම ඉහළ නැංවීමට අවශ්‍ය ජවය ලබා ගත හැකි වේ. එහිදී විශේෂයෙන්ම ගනුදෙනු පිරිවැය අඩු කිරීමෙන් සුළු හා මධ්‍ය පරිමාණ ව්‍යවසායන්හි සාධන මට්ටම වැඩි දියුණු කිරීමට සමාජ ප්‍රාග්ධනය උපකාරීවේ. (Fafchamps & Minten, 2002).

Frederick et al. (2017) දී ගයානාව ආශ්‍රයෙන් සිදු කළ පර්යේෂණයක් මගින් හෙළි කර ඇත්තේ සමාජ ප්‍රාග්ධනය හරහා සුළු හා මධ්‍ය පරිමාණ ව්‍යවසායන්හි සාධන මට්ටම සමග අනුලෝම සබඳතාවක් පෙන්නුම් කෙරෙන බවයි. මෙම අධ්‍යයනයේ ප්‍රතිපල මගින් තවදුරටත් පැහැදිලි කරනුයේ සුළු හා මධ්‍ය පරිමාණ ව්‍යවසායන්හි සාර්ථකත්වය සඳහා සමාජ ප්‍රාග්ධනය සහ නව්‍යතා ඉතා වැදගත් කාර්යභාරයක් ඉටු කරන බවයි. සමාජ ප්‍රාග්ධනය නව්‍යතා මත ධනාත්මක බලපෑමක් ඇති කරන බව ඉහත අධ්‍යයනය මගින් හෙළිකර ඇත.

***ශක්තිමත් පසු සම්බන්ධතා (Strong Backward Linkage) ගොඩනැගීමට සහාය වීම***

ශ්‍රී ලංකාවේ සුළු හා මධ්‍ය පරිමාණ ව්‍යවසායන් හා දේශීය කෘෂිකාර්මික අංශය අතර ශක්තිමත් පසු සම්බන්ධතා ගොඩනැගීමේ හැකියාව පවති. සුළු හා මධ්‍ය පරිමාණ ව්‍යවසායක අංශයේ නිෂ්පාදන කටයුතු සඳහා අවශ්‍ය බොහෝ අමුද්‍රව්‍ය කෘෂිකාර්මික අංශය මගින් සැපයේ (Nishantha & Padmasiri, 2010). සුළු හා මධ්‍ය පරිමාණ ව්‍යවසායක අංශය සහ දේශීය කෘෂිකාර්මික අංශය එකිනෙකට අනුපූරකව ක්‍රියාත්මක වීමෙන් ආදායම ඉහළ නැංවීමට උපකාරී වී දිළිඳුකම පිටුදැකීමට අවශ්‍ය ශක්තිය ලබා දේ.

කෘෂිකාර්මික අංශය මගින් මුදා හැරෙන අමුද්‍රව්‍ය ලාභදායීව සුළු හා මධ්‍ය පරිමාණ ව්‍යවසාය අංශයේ උපයෝජනයෙන් එම අංශයේ එකතු කළ අගය (Value Added) ඉහළ නැංවීමේ විභවතා පවතී. Barbin (2017) සිදු කළ අධ්‍යයනයට අනුව පසු සම්බන්ධතා නිසා අමුද්‍රව්‍ය සහ තාක්‍ෂණය සඳහා ප්‍රවේශවීමටත්, වෙළෙඳපොළ තොරතුරු ලබා ගැනීමට හා අලෙවිකරණ සහය ලබා ගැනීමටත් පුළුල් අවකාශ පවතින බව හෙළිකර ඇත. මෙය එම අංශයේ යෙදී සිටින පිරිස්වල ආදායම් මට්ටම ඉහළ යාමටත් ජීවන තත්ත්වය උසස් කරගැනීමටත් සහ ප්‍රජාවේ දිළිඳුකම අඩුකරගැනීමටත් මග පෙන්වනු ලැබේ.

ශ්‍රී ලංකාවේ සුළු හා මධ්‍ය පරිමාණ ව්‍යවසායක අංශය එය සතු පූර්ණ ධාරිතාවෙන් යුතුව ක්‍රියාත්මක නොවේ. එය තවදුරටත් රටේ සමාජ - ආර්ථික සංවර්ධනය සඳහා දායක වන තිරසර ව්‍යවසායක අංශයක් ලෙස ක්‍රියාත්මක වීමට අවශ්‍ය විශාල විභවයක් සහිත අංශයකි. විශේෂයෙන්ම සුළු හා මධ්‍ය පරිමාණ ව්‍යවසායක අංශය තුළ තරගකාරීත්වය (Competitiveness) ප්‍රවර්ධනය කිරීම අත්‍යවශ්‍ය වේ (Harvie, 2010). එහි විභවතා පූර්ණ වශයෙන් නිරාවරණය වන පරිදි ශ්‍රී ලංකාවේ සුළු හා මධ්‍ය පරිමාණ ව්‍යවසායක අංශය තුළ තරගකාරිත්වය වර්ධනය කිරීමට අවශ්‍ය උපායමාර්ග රාශියක් පවතී. ඒවා අතර පහත තරගකාරීත්ව උපායමාර්ග ඉතා වැදගත් වේ.

## *නව්‍යතා උපායමාර්ගය (Innovation Strategy)*

Bhaskaran (2006) දී පෙන්වා දී ඇත්තේ සුළු හා මධ්‍ය පරිමාණ ව්‍යවසායක අංශය නව්‍යතා උපායමාර්ග භාවිත කිරීම නිසා එම අංශය ලාභදායී අංශයක් බවට පත්ව ඇති බවයි. එහි දී නව්‍යතා උපායමාර්ග යොදා ගැනීම නිසා නිෂ්පාදන කාර්යක්ෂමතාව වර්ධනය වීමෙන් තරගකාරීත්ව වාසි (Competitive Advantages) ගොඩනැගී ඇත. මෙමගින් සුළු හා මධ්‍ය පරිමාණ ව්‍යවසායක අංශයේ යහපත් කාර්යසාධනයක් නිර්මාණය වී ඇති බව ඔහු තවදුරටත් තම පර්යේෂණය මගින් තහවුරු කර ඇත.

Hall et al. (2009) ට අනුව නව්‍යතා රටක සුළු හා මධ්‍ය පරිමාණ ව්‍යවසායක අංශයේ ඵලදායීතාව මත ප්‍රබල ධනාත්මක බලපෑමක් කිරීමට සමත් බව හෙළි කර ඇත. නව්‍යතා උපායමාර්ග නිසා රටක සුළු හා මධ්‍ය පරිමාණ ව්‍යවසායක අංශයේ ඵලදායීතාව වර්ධනය වීම නිසා ව්‍යවසායක අංශය ශක්තිමත් අංශයක් බවට පරිවර්තනය වේ. මේ අනුව සුළු හා මධ්‍ය පරිමාණ ව්‍යවසායන්හි අයභාරය වැඩිවීමකට මෙන්ම පිරිවැය අවම මට්ටමකින් පවත්වා ගැනීමට හැකියාව නිර්මාණය වේ. මෙම අංශයේ ශ්‍රමිකයන්ගේ ආදායම් මට්ටම ඉහළ යන අතරම තවදුරටත් ව්‍යවසායක අංශය පුළුල් කර ගැනීමට අවකාශ විවර වන නිසා තවදුරටත් නව රැකියා අවස්ථා ජනනයෙන් දරිද්‍රතාව පිටුදැකීමට යෝග්‍ය පසුතලය නිර්මාණය වේ.

ශ්‍රී ලංකාවේ සුළු හා මධ්‍ය පරිමාණ ව්‍යවසායන්හි ඵලදායිතාව සහ ප්‍රතිලාභ ඉහළ නැංවීම සඳහා තම දැනුම් පදනම (Knowledge Base) ප්‍රසාරණය කරන අතරම ඊට ගැළපෙන නව්‍යතා උපාය මාර්ග යොදා ගැනීම කළ හැකිය. තම නිෂ්පාදන අපනයන වෙළෙඳපොළ අභිමුඛ වන විට නිෂ්පාදන මාදිලි හා මෝස්තර මෙන්ම එම නිෂ්පාදන වල

ගුණාත්මකභාවය ද ඉතා වැදගත් වේ. එහි දී නව්‍යතාවලට කළ හැකි කාර්යභාරය අතිමහත් ය.

ශ්‍රී ලංකාව තුළ නව්‍යතා උපායමාර්ගය වඩාත් සාර්ථකව දියත් කිරීමට ප්‍රමාණවත් සහ යෝග්‍ය බහුජාතික සමාගම්වල ප්‍රබල ස්ථාපිත වීමක් නොමැති බැවින් විකල්පව සෙසු සුළු හා මධ්‍ය පරිමාණ ව්‍යවසායන් සමග සහයෝගීතා ජාලයක් (Collaborative Networks) ගොඩනැගීමෙන් (Bhaskaran, 2006) එම ව්‍යවසායකයන්ට ඉහළ ප්‍රතිලාභ හිමි කර ගැනීමට අවස්ථාව පවතී.

***තොරතුරු තාක්ෂණ උපායමාර්ගය (Information Technology Strategy)***

සුළු හා මධ්‍ය පරිමාණ ව්‍යවසායක අංශයේ වර්ධනය සඳහා තොරතුරු තාක්‍ෂණය ප්‍රබල බලපෑමක් සිදු කරයි. සුළු හා මධ්‍ය පරිමාණ අංශයේ ඵලදායීතාව ඉහළ නැංවීමට තොරතුරු තාක්‍ෂණය ප්‍රබල ලෙසම බලපාන බව තහවුරු කර ඇත (Oluwafemi, 2015). එසේම Ashrafi සහ Murtaza (2008) දී සිදු කළ පර්යේෂණයක් මගින් පෙන්වා දී ඇත්තේ ආයතනයක ඵලදායීතාව, ලාභදායීතාව, වෙළෙඳපොළ වටිනාකම සහ වෙළෙඳපොළ පංගුව යන ක්ෂේත්‍ර විෂයන්හි තොරතුරු තාක්‍ෂණය ධනාත්මක බලපෑමක් කරන බවයි.

නැගෙනහිර ආසියාතික රටවල එහි දී විශේෂයෙන්ම සිංගප්පූරුව සහ තායිපේ චීනය ඉතා සාර්ථක මට්ටමින් තාක්‍ෂණ හා නව්‍යතා උපායමාර්ග දියත් කිරීම මගින් සුළු හා මධ්‍ය පරිමාණ ව්‍යවසායන්හි සාධන මට්ටම ඉහළ නංවා ගැනීමට සමත්ව ඇත (Intarakumnerd & Goto, 2016).

ශ්‍රී ලංකාවේ සුළු හා මධ්‍ය පරිමාණ ව්‍යවසායන්හි පිරිවැය අවම කොට ඵලදායිතාව ඉහළ නැංවීම සඳහා තොරතුරු තාක්ෂණය යොදා ගැනීමට විශාල අවකාශ පවතී. නිෂ්පාදනවල ගුණාත්මක බව මෙන්ම වෙළෙඳපොළ පිළිබඳ නිවැරදි තොරතුරු ලබා ගැනීමට මෙම උපාය මාර්ගය වැදගත් වේ.

ශ්‍රී ලංකාවේ ද සුළු හා මධ්‍ය පරිමාණ ව්‍යවසායක අංශයට තොරතුරු තාක්‍ෂණය තිරසරව යොදා ගැනීම මගින් එම ව්‍යවසායන්හි පිරිවැය අවම කර ගැනීමට අවකාශ පවතින නිසා එමගින් එම අංශයේ සේවානියුක්තිකයන්ගේ ආර්ථික ශක්තිය ගොඩනැංවීම හරහා දරිද්‍රතාව පිටුදැකීමට අවශ්‍ය පරිසරය නිර්මාණය කළ හැකි වේ.

### *ජාලමය උපායමාර්ගය (Network Strategy)*

රටක සුළු පරිමාණ ව්‍යවසායන්හි වර්ධනය හා සංවර්ධනය සඳහා ඉතා වැදගත් මෙවලමක් ලෙස ජාලමය උපායමාර්ගය වැදගත් වේ (Naudé et al., 2014; Shaw & Conway, 2000). එක් එක් සුළු පරිමාණ ව්‍යවසායන්හි ගැටලු නිරාකරණයට මෙන් ම එම ව්‍යවසායන්හි තරගකාරී තත්ත්වය ප්‍රවර්ධනය කර ගැනීමට ජාලමය උපායමාර්ගය ප්‍රබල මඟපෙන්වීමක් කර ඇති බව UNIDO (2001) දී පෙන්වා දී ඇත.

දකුණු ආසියාවේ සුළු හා මධ්‍ය පරිමාණ ව්‍යවසායන්හි විධිමත් ජාලගතවීමක් නොමැතිවීම (Lack of Proper Networking) නිසා එම ව්‍යවසායන්ට අවස්ථා පුළුල් කර ගැනීමට නොහැකි පසුබිමක් යටතේ ජාලමය උපායමාර්ග හරහා ඇතිකරගන්නා විතැන්වීමත් මගින් ශ්‍රී ලංකාව ඇතුළු ව දකුණු ආසියානු රටවල සමාජ ආර්ථික සංවර්ධනය කඩිනම් කිරීමටත් දරිද්‍රතාව අඩුකර ගැනීමටත් විශාල විභවතාවක් පවති (Thrikawala, 2011; United Nations, 2011). තවද, Premaratne (2001) පෙන්වා දී ඇත්තේ ජාලමය සම්බන්ධතා මගින් සුළු හා මධ්‍ය පරිමාණ ව්‍යවසායන්ට විශාල සම්පත් ප්‍රමාණයක් ලබාගත හැකි බවයි.

ශ්‍රී ලංකාවේ සුළු හා මධ්‍ය පරිමාණ ව්‍යවසායන් අතර මෙන්ම සෙසු මහා පරිමාණ ව්‍යවසායන් සමග සහයෝගීතාවක් ඇති කර ගැනීම හරහා ස්වකීය ව්‍යවසායන් ප්‍රසාරණයට මෙන්ම නවයතා සහ නව තාක්ෂණය උරා ගැනීමට අවශ්‍ය පසුබිම ජාලමය උපායමාර්ගවලින් ගොඩනැගිය හැකිවේ. විශේෂයෙන්ම ප්‍රාදේශීය නිෂ්පාදන ජාල ශක්තිමත් වීම තුළින් නිෂ්පාදන හා බෙදාහැරීමේ ජාල (Production and Distribution Network) ශක්තිමත් කර ගැනීමට විශාල අවකාශ පවතී.

### *පොකුරු උපාය මාර්ගය (Cluster Strategy)*

සුළු හා මධ්‍ය පරිමාණ ව්‍යවසායන්ගේ ස්ථාපිත වීම, වර්ධනයට සහ රැකියා නිර්මාණය කිරීම සම්බන්ධව පොකුරු උපායමාර්ගය ඉතා වැදගත් බව පර්යේෂකයන් ගණනාවක් අනාවරණය කර ඇත. (Klein & Hadjimichael, 2003 ; Glaeser, 1998 ; Audrctsch, 2002). පොකුරු උපායමාර්ගය අනුගමනය කිරීම හරහා ඉරානය, වියට්නාමය, ඉංදුනිසියාව, තායිවානය, ජපානය සහ කොරියාව යනාදි රටවල සුළු හා මධ්‍ය පරිමාණ ව්‍යවසායන් විශාල ප්‍රතිලාභ අත්කර ගැනීමට සමත් ව ඇත (Foghani et al., 2017).

ශ්‍රී ලංකාවේ සුළු හා මධ්‍ය පරිමාණ ව්‍යවසායන් සෙසු තරගකාරී ව්‍යවසායන් සමග සමීපව කටයුතු කිරීම මගින් එකිනෙකා අතර දැනුම හුවමාරු කර ගැනීමට මෙන්ම නිෂ්පාදන ක්‍රියාවලියේ දී පැන නගින ගැටලු වල දී මග පෙන්වීම් ලබා ගැනීමට අවශ්‍ය ඉහළ විභවතා,

පොකුරු උපායමාර්ග තුළ ගැබ්ව පවතී. කාර්මික ජීවන චක්‍රයේ මුල් අවධීන් තුළ මෙම උපායමාර්ගය ඉතා වැදගත් වන අතර ප්‍රාදේශීය මට්ටමේ ක්‍රියාත්මක වන සුළු හා මධ්‍ය පරිමාණ ව්‍යවසායන්හි මහා පරිමාණ පිරිමැසුම් නිර්මාණය කිරීම සඳහා මග පෙන්වනු ලැබේ. මහා පරිමාණ මට්ටමින් යෙදවුම් ලබා ගැනීම, ප්‍රශස්ත මට්ටමින් යන්ත්‍ර සූත්‍ර භාවිත කිරීම සහ මහා පරිමාණ මට්ටමේ ඇණවුම් සැපයීම සඳහා නිෂ්පාදන ධාරිතා ඒකාබද්ධ කිරීම් වැනි ක්‍රියාමාර්ග වලින් මහා පරිමාණ පිරිමැසුම් (Economies of Scale) ළඟා කර ගැනීමට මෙම උපායමාර්ගය දායක වන අතරම එය සුළු හා මධ්‍ය පරිමාණ ව්‍යවසායන් ඒකාබද්ධවීම හරහා සිදු කළ හැකිය (UNIDO, 2001).තවදුරටත් ශ්‍රී ලංකාවේ ව්‍යවසායන් අතර සංවාද සහ සහයෝගිතාව ප්‍රවර්ධනය කර ගැනීම සඳහා අවශ්‍ය රාමුව පොකුරු උපායමාර්ගය තුළින් නිර්මාණය කෙරේ. අනුපූරක නිෂ්පාදන අවස්ථා ඇතිකර ගැනීම, ඒකාබද්ධ පුහුණුවීම් සිදුකිරීම, අන්‍යෝන්‍ය වශයෙන් අරමුදල් භාවිත කිරීම සහ ඒකාබද්ධ අලෙවිකරණය (Joint Marketing Initiatives) යන ඒවා එකී රාමුව තුළ වැදගත් අංගයන් ලෙස දැක්විය හැකි ය. පොකුරු උපායමාර්ගය හරහා ශ්‍රී ලංකාවේ සුළු හා මධ්‍ය පරිමාණ ව්‍යවසායක අංශය ඉදිරියට ගෙන ඒමට හැකියාව පවතී. (Dasanayake & Sardana, 2015).

***විදේශ සෘජු ආයෝජන උපායමාර්ගය (Foreign Direct Investment Strategy)***

ගෝලීය ආර්ථික ඒකාබද්ධතා ගොඩනැගීම සම්බන්ධව තීරණාත්මක සාධකයක් ලෙස විදේශ සෘජු ආයෝජන සැලකේ. ප්‍රාග්ධන තොගයේ සහ ශ්‍රම බලකායේ ඉහළ යාම ආර්ථික වර්ධනය ඉහල යාමට දායකත්වය සපයන බව ආර්ථික වර්ධනය සඳහා වන නව සම්භාව්‍ය ආකෘතිය අවධාරණය කොට ඇත.

යම් රටක සුළු හා මධ්‍ය පරිමාණ ව්‍යවසායන් මත විදේශ ආයෝජනවල බලපෑම (Spillover Effect of Foreign Direct Investment on SMES) සෘජු බලපෑම හා වක්‍ර බලපෑම වශයෙන් දෙ අකාර වේ. (Tuluce & Dogan, 2014). තාක්ෂණය උසස් කිරීම සහ ප්‍රාග්ධන රාශිකරණය පුළුල් කිරීමෙන් ශක්තිමත් ආර්ථික වර්ධනයකට අවශ්‍ය පදනම ගොඩ නැගෙන බව විදේශ ආයෝජනවල සෘජු බලපෑම යටතේ අවධාරණය කෙරේ. මෙම ක්‍රියාවලිය යටතේ දේශීය සුළු හා මධ්‍ය පරිමාණ ව්‍යවසායන්වල ප්‍රාග්ධන අවශ්‍යතා සහ තාක්ෂණය සමඟ බද්ධ වූ දැනුම (Technology and Know Now) අන්තර්ග්‍රහණය කර ගැනීමට හැකියාව ලැබීම නිසා එම ව්‍යාපාරවල නිෂ්පාදන ඵලදායිතාව ඉහළ නංවා ගැනීමට විශාල විභවතාවක් පවතී. (Javorcik, 2004; Pack & Saggi, 2001; Markusen & Venables, 1999)

රටක ආර්ථික වර්ධනය මත විදේශ ආයෝජනවල වක්‍ර හෙවත් පිටාරගැලීමේ ප්‍රතිවිපාකය (Spillover Effect) දෙ ආකාර වේ. (BlomStrom & Kokko, 1998). එනම් ඵලදායිතා ප්‍රතිවිපාකය (Productivity Spillovers) සහ වෙළෙඳපොල ප්‍රවේශ ප්‍රතිවිපාකය (Market Access Spillovers) වශයෙනි. විදේශ බහුජාතික ආයතන විදේශ ආයෝජන ලබා ගන්නා රටවලට ප්‍රවේශ වීම මගින් දේශීය  සුළු හා මධ්‍ය පරිමාණ ව්‍යාපාරවල ඵලදායිතාව ඉහළ යාමට මඟ පෙන්වීම ඵලදායිතා ප්‍රතිවිපාකය වශයෙන් අදහස් වේ.

විදේශ බහුජාතික සමාගම් හරහා දේශිය සුළු හා මධ්‍ය පරිමාණ ව්‍යවසායන්ට විදේශීය අපනයන වෙළෙඳපොළට ප්‍රවේශ වීමට ඇති අවස්ථා වැඩි දියුණු වීම වෙළෙපොළ ප්‍රවේශ ප්‍රතිවිපාකය ලෙස අදහස් වේ.

පොදුවේ බහුජාතික ආයතන හරහා විදේශ ඍජු ආයෝජන දේශීය සුළු හා මධ්‍ය පරිමාණ ව්‍යවසායක අංශයට ආකර්ෂණය කර ගැනීම මගින් සේවා නියුක්ති අවස්ථා ඉහළ යාම, අපනයනය ඉහළ යාම, බදු ආදායම් ඉහළ යාම සහ යෝග්‍යය තාක්ෂණික දැනුම අත්කර ගැනීමට හැකි වීම (Tuluce & Dogan, 2014) මගින් එම ව්‍යවසායන්හි තිරසර පැවැත්ම සහතික කළ හැකිය. එමගින් සුළු හා මධ්‍ය පරිමාණ ව්‍යවසායන් ශක්තිමත් වීම ශ්‍රී ලංකාවේ දරිද්‍රතාව  පිටුදැකීමට මහඟු පිටුබලයක් වනු ඇත. මෙහි දී පූර්ව අවශ්‍යතාවක් වන්නේ දේශීය සුළු හා මධ්‍ය පරිමාණ ව්‍යවසායක අංශයට විදේශ ආයෝජන ආකර්ෂණය කර ගැනීමට යෝග්‍ය හා යහපත් ප්‍රතිපත්ති (Sound Policies) ක්‍රියාවට නැංවීමට රජය කටයුතු කිරීමේ අවශ්‍යතාවයි.

සුළු හා මධ්‍ය පරිමාණ ව්‍යවසායන් තුළ තරගකාරීත්වය වර්ධනය කොට අපනයන අභිමුඛ ව්‍යවසායක අංශයක් බිහි කිරීමේ දී විදේශ ඍජු ආයෝජන වලට විශාල කාර්යභාරයක් පවතී. එය ඉතා වැදගත් උපායමාර්ගයකී. දේශීය සුළු හා මධ්‍ය පරිමාණ ව්‍යවසායන් (දේශීය පෞද්ගලික අංශය) හා විදේශීය ඍජු ආයෝජන ලබා දෙන ආයතන (විදේශීය පෞද්ගලික අංශය - පරජාතික සමාගම්) අතර දේශීය පෞද්ගලික හා විදේශීය පෞද්ගලික හවුල්කාරීත්වයන් (Domestic and Foreign Private Partnership) ගොඩනැගීම හරහා විශාල ප්‍රතිලාභ හිමිකර ගැනීමට හැකියාව පවතී. නව දැනුම, නව තාක්ෂණය, හා කළමනාකරණ විධික්‍රම මගින් පෝෂණය වන සුළු හා මධ්‍ය පරිමාණ ව්‍යවසායකයන්ට තම ඵලදායිතාව ඉහළ නංවා ගැනීමටත්, පිරිවැය අඩුකර ගැනීමටත් මග පෑදේ.

***සැපයුම් දාම උපායමාර්ගය (Supply Chain Strategy)***

සුළු හා මධ්‍ය පරිමාණ ව්‍යවසායන්ගේ වර්ධනය සහ ගනුදෙනුකරුවන්ගේ වටිනාකම ගොඩනැගීම සඳහා සැපයුම් දාම ඉතා වැදගත් කාර්යභාරයක් සිදු කරයි (Chandak, 2018). සැපයුම් දාම උපාය මාර්ගය සහ සුළු හා මධ්‍ය පරිමාණ ව්‍යවසායකයන්ගේ කාර්යසාධනය අතර ධනාත්මක සබඳතාවක් පවතින බව බොහෝ පර්යේෂණ මගින් පෙන්වා දී ඇත (Tan, 2002; Li et al., 2006; Koh et al., 2007; Chandak, 2018).

මහා පරිමාණ ආයතනවලට සාපෙක්ෂව සුළු හා මධ්‍ය පරිමාණ ව්‍යවසායන්ට ස්වකීය නව්‍යතා හැකියාවන් (Innovating Capability) ගොඩනැගීමට සහ වෙළෙඳපොළ කරා කාර්යක්ෂමව පිවිසීමට සැපයුම් දාම සම්බන්ධතා ඉතා වැදගත් මඟ පෙන්වීමක් කරයි. (So & Sun, 2010; Lambert & Schwieterman, 2012)

Zeng et al. (2010) ගේ අධ්‍යයනයකට අනුව සනාථ වී ඇත්තේ සුළු හා මධ්‍ය පරිමාණ ව්‍යවසායන්හි නව ක්‍රම සහ නව අදහස්වල අත්කර ගැනීම් (Innovative Performance) සඳහා අන්තර් ආයතන සහයෝගීතාව (Inter-Firm Cooperation) ධනාත්මක බලපෑමක් කර ඇති බවයි. තවද සැපයුම් දාම යටතේ පර්යේෂණ හා සංවර්ධන සම්බන්ධතා (Research and Development Partnerships) මගින් සුළු හා මධ්‍ය පරිමාණ ව්‍යවසායන්ට මූලික වශයෙන්ම ප්‍රතිලාභ ලබා ගැනීමට හැකියාව පවතී (Rezaei et al., 2015).

විදේශ බහුජාතික සමාගම් (Transnational Corporations) මෙන්ම දේශීයව ක්‍රියාත්මක වන විශාල සමාගම් වලට අවශ්‍ය කරන අමුද්‍රව්‍ය හා සේවා සැපයීමේ හැකියාව සුළු හා මධ්‍ය පරිමාණ ව්‍යවසායන් සතුවේ. තව ද, තාක්ෂණය සමග නව කළමනාකරණ නිපුණතා (New Management Skills) කරා ප්‍රවේශ වීමට හැකියාව නිර්මාණය වීමෙන් දේශීය ව්‍යවසායකයන්ට ඉහළ ප්‍රතිලාභ අත්කර ගැනීමට පදනම ගොඩ නැගේ.

ගෝලීය වටිනාකම් දාම (Global Value Chains) සමග සුළු හා මධ්‍ය පරිමාණ ව්‍යවසායන්ට ඒකාබද්ධ වීමට අවශ්‍ය පදනම මෙම උපාය මාර්ගය හරහා නිර්මාණය කර ගත හැකිවේ (UNIDO, 2004). එහිදී තාක්ෂණය උසස් කර ගැනීම, කාර්මික හා කළමනාකරණ නිපුණතා වැඩි දියුණු කර ගැනීම සහ වෙළෙඳපොළ ප්‍රවේශ ශක්තිමත් වීම සහ පුළුල්වීම යන ධනාත්මක අවස්ථා විවර වීම සිදුවේ (Luetkenhorst, 2004). සැපයුම් දාම උපායමාර්ගය යොදා ගැනීම මගින් සුළු හා මධ්‍ය පරිමාණ ව්‍යවසායන්හි පිරිවැය පහළ යාම, දේශීය සැපයුම ඉහළ යාම, පරිසරය මත ඇති කෙරෙන අහිතකර බලපෑම් අවම වීම,

තත්ත්ව පාලන වැඩි දියුණු වීම සහ සන්නාම නාම ඉහළ යාම යනාදි ධනාත්මක ප්‍රතිලාභ අත්කර ගැනීමට අවස්ථාව හිමි වේ (UNIDO, 2004).

ශ්‍රී ලංකාවේ සුළු හා මධ්‍ය පරිමාණ ව්‍යවසායන් හි සැපයුම් දාම ශක්තිමත් කිරීමට අවශ්‍ය ක්‍රියා මාර්ග දියත් කිරීම රජයේ අත්‍යවශ්‍ය කාර්යභාරයකි. එහි දි සිංගප්පූරුව මෙම උපාය මාර්ග යටතේ යහපත් අත්කර ගැනීම් සිදු කර ඇති අතර විශේෂයෙන්ම රජය භෞතික හා අතථ්‍ය පොදු කාර්ය පහසුකම් (Physical and Virtual Infrastructure) ප්‍රමාණවත්ව සැපයීම හරහා වඩා ඵලදායිව ගෝලීය හා ප්‍රදේශීය සැපයුම් ජාල කරා ප්‍රවේශවීමට සුළු හා මධ්‍ය පරිමාණ ව්‍යවසායන්ට හැකියාව ලැබී ඇත (Goh, 2002).

ශ්‍රී ලංකාවේ සුළු හා මධ්‍ය පරිමාණ ව්‍යවසායක අංශයට සැපයුම් දාම උපාය මාර්ගය යටතේ විශාල ප්‍රතිලාභ අත්කර ගත හැකි අතර එහි දී විශේෂයෙන් ම ශ්‍රී ලංකාවේ සුළු හා මධ්‍ය පරිමාණ තේ නිෂ්පාදන අංශය විෂයයෙහි සැපයුම් දාම ශක්තිමත් කිරීම (Kohona, 2002) මගින් විශාල ප්‍රතිලාභ හිමි කර ගැනීමට අවස්ථා පවතී. මෙහි දී විශේෂයෙන් ම වතු අංශය ඇතුළත්ව ග්‍රාමීය අංශයට සංකේන්ද්‍රණය වී පවතින දරිද්‍රතාව පිටුදැකීම සම්බන්ධව සුළු හා මධ්‍ය පරිමාණ ව්‍යවසායන්ට විභව කාර්යභාරයක් කළ හැකි බව පැහැදිලි ය.

***ශ්‍රී ලංකාවේ සුළු හා මධ්‍ය පරිමාණ ව්‍යවසායක අංශය මුහුණ දෙන ගැටලු***

ශ්‍රී ලංකාව ඇතුළුව බොහෝ සංවර්ධනය වෙමින් පවතින රටවල සුළු හා මධ්‍ය පරිමාණ ව්‍යවසායක අංශය එහි පූර්ණ විභවතා සඳහා ළඟා වී නොමැති බව බොහෝ අධ්‍යයන මගින් හෙළි කර ඇත. මෙහි දී සංවර්ධනය වෙමින් පවතින රටවල සුළු හා මධ්‍ය පරිමාණ ව්‍යවසායක අංශයේ සංවර්ධනය මූල්‍ය සහ මූල්‍ය නොවන බාධක කිහිපයක් මගින් අවහිර කොට ඇත (Adeusi & Aluko, 2014; Beck, Demirgüç-Kunt & Maksimovic, 2005; Oduntan, 2014; දිල්රුක්ෂිනි, 2004). මූල්‍ය ප්‍රාග්ධනය සඳහා ප්‍රමාණවත් නොවන ප්‍රවේශය, ප්‍රමාණවත් නොවන පොදුකාර්ය පහසුකම්, අලෙවිකරණ ගැටලු, පහළ මට්ටමේ ව්‍යවසායක නිපුණතා, සාර්ව ආර්ථික තත්ත්වය, දේශපාලන අස්ථාවර බව, ස්ථානීය ගැටලු හා තරගකාරිත්වය යන ගැටලු ප්‍රධාන වශයෙන් කැපී පෙනේ. ප්‍රමාණවත් මට්ටමක මූල්‍ය සම්පත් අත්කර ගැනීමට නොහැකි වීම ශ්‍රී ලංකාවේ සුළු හා මධ්‍ය පරිමාණ ව්‍යවසායන් සංවර්ධනය සම්බන්ධව ඉතා ප්‍රබල ගැටලුවක් වේ (Asian Development Bank, 2019).

ශ්‍රී ලංකාවේ දකුණු පළාත කේන්ද්‍ර කොට සිදු කළ අධ්‍යයනයට අනුව එම පළාතේ සුළු හා මධ්‍ය පරිමාණ ව්‍යවසායකයන් මුහුණ දෙන ප්‍රධාන ගැටලු කිහිපයක් හඳුනා ගනු ලැබිණි (08 සංඛ්‍යා සටහන).

**සංඛ්‍යා සටහන 08 : සුළු හා මධ්‍ය පරිමාණ ව්‍යවසායන් මුහුණ දෙන ගැටලු**

| ගැටලුව | ව්‍යවසායන්ගේ ප්‍රතිශතය | මූලිකම ගැටලුවක් වනබව අවධාරණය කළ ප්‍රතිශතය |
|---|---|---|
| ප්‍රාග්ධනය සහ සම්පත් | 42 | 14.5 |
| තරඟකාරීත්වය | 35 | 12.9 |
| සාර්ව ආර්ථික තත්ත්වය | 32 | 11.6 |
| පොදුකාර්ය පහසුකම් | 24 | 10.0 |
| පරිපාලන ගැටලු | 15 | 4.8 |

මූලශ්‍රය : ක්ෂේත්‍ර අධ්‍යයනය, 2015.

අධ්‍යයනට ලක් කළ ව්‍යවසායකයන්ගෙන් සියයට 42 ක්ම ප්‍රධාන ගැටලුවක් ලෙස අවධාරණය කරනු ලැබුයේ ප්‍රමාණවත් පරිදි ප්‍රාග්ධනය සහ අවශ්‍ය සම්පත් කරා ප්‍රවේශ වීමට ප්‍රබල බාධා පවතින බවයි. මෙහි දී මෙම ගැටලුව තමා ඉදිරියේ පවතින මූලිකම ගැටලුවක් බව සියයට 15 ක් පමණ අවධාරණය කළහ. අධ්‍යයන ප්‍රදේශය පදනම් කරගෙන සිදු කළ නාභිගත සම්මුඛ සාකච්ඡාවලදීද (Focus Group Interviews) අනාවරණය වූයේ ඔවුන්ගෙන් තුනෙන් දෙකක්ම ප්‍රමාණවත් ප්‍රාග්ධනයක් සපයා ගැනීම සම්බන්ධයෙන් පීඩා විඳින බවයි. සුළු හා මධ්‍ය පරිමාණ ව්‍යවසායක අංශය මුහුණ දෙන තවත් ප්‍රබල ගැටලුවක් වන්නේ තරගකාරිත්වය යි. අධ්‍යයන ප්‍රදේශයේ ව්‍යවසායකයින්ගෙන් සියයට 35 ක්ම මෙම ගැටලුවට මුහුණ දෙන අතර ඔවුන්ගෙන් සියයට 13 ක් පමණ තමා මුහුණ දෙන ප්‍රධානම ගැටලුවක් ලෙස මෙය අවධාරණය කළහ. වෙළෙඳපොළ සීමාවීම සහ එය ස්ථාවර වීම මේ සඳහා හේතු සාධක වී ඇති බව හෙළි විය. අධ්‍යයන ප්‍රදේශයේ ව්‍යවසායකයින් විෂයයෙහි පවතින තවත් ප්‍රබල ගැටලුවක් වන්නේ සාර්ව ආර්ථික තත්ත්වයේ සිදුවන වෙනස්කම්ය. මෙය සැලකිය යුතු ප්‍රතිශතයක් වන අතර ව්‍යවසායකයන්ගෙන් සියයට 32 ක්ම එය ගැටලුවක් ලෙස සඳහන් කර ඇති අතර එයින් සියයට 12 ක් පමණ මෙය ප්‍රබල ගැටලුවක් ලෙස අවධාරණය කර ඇත. භාණ්ඩ හා සේවා නිෂ්පාදනය සම්බන්ධව ප්‍රමාණවත් නිපුණතා නොමැතිවීම (සියයට 30) රජය සහ ඊට සම්බන්ධ පරිපාලන ගැටලු (සියයට 15), පොදුකාර්ය පහසුකම් පිළිබඳ ගැටලු (සියයට 24) සහ ශ්‍රමය සම්බන්ධව පවත්නා සංරෝධක ව්‍යවසායකයින් විෂයයෙහි පවත්නා ගැටලු ලෙස ඔවුන් විසින් අවධාරණය කරනු ලැබිණි.

**සමාලෝචනය**

ශ්‍රී ලංකාවේ ජාතික දරිද්‍රතාව සැලකිය යුතු මට්ටමකින් පහළ වැටුණ ද භූගෝලීය වශයෙන් එහි අසමානතා හඳුනා ගත හැකි අතර එය ග්‍රාමීය ප්‍රපංචයක් බව ඉහත තොරතුරු මගින් සනාථ කෙරේ. ශ්‍රී ලංකාවේ ඉහළ ආර්ථික වර්ධනයක් සහතික කිරීමේ හා විරැකියාව, අසමානතාව හා දරිද්‍රතාව පිටුදැකීමේ වැදගත් උපායමාර්ගික අංශයක් ලෙස සුළු හා මධ්‍ය පරිමාණ ව්‍යවසායක අංශය හඳුනා ගෙන ඇත. මෙම අධ්‍යයනයට අනුව ශ්‍රී ලංකාවේ සුළු හා මධ්‍ය පරිමාණ ව්‍යවසායක අංශය පදනම් කර ගෙන ශ්‍රී ලංකා දරිද්‍රතා ව්‍යාප්තිය පවතින ප්‍රාදේශීය අසමානතා පිටුදැකීමට විශාල අවකාශ පවතින බව තහවුරු වේ. දේශීය ආර්ථිකයට අනන්‍ය වූ හැඩහුරුකමින් යුතු සුළු හා මධ්‍ය පරිමාණ ව්‍යවසායන් අවම ප්‍රාග්ධනයන් මත ස්ථාපිත කළ හැකි අතර බහුතරයක් වන අඩු ආදායම්ලාභී ජන කොටස්වල පරිභෝජනයට අවශ්‍ය භාණ්ඩ හා සේවා නිෂ්පාදනය ශ්‍රම සූක්ෂම නිෂ්පාදන මාදිලි හරහා සිදු කළ හැකිය. මෙමගින් ශ්‍රී ලංකාවේ ග්‍රාමීය අංශයට බරව පවතින තරුණ ස්ත්‍රී සේවා වියුක්තියට විභව විසඳුමක් ලබා ගැනීම සඳහා සුළු හා මධ්‍ය පරිමාණ ව්‍යවසායක අංශය දිරිමත් කළ හැකි අතර ම භූගෝලීයව පැතිර පවත්නා දරිද්‍රතාවේ අසමානතා ද පිටුදැකීමට එමගින් ජවයක් සැපයේ. එහි පූර්ණ ධාරිතාවෙන් යුතුව ක්‍රියාත්මක වීමට සංරෝධකව ක්‍රියාත්මක වන ගැටලු කිහිපයකට ශ්‍රී ලංකාවේ සුළු හා මධ්‍ය පරිමාණ ව්‍යවසායක අංශය මුහුණ දෙන බව මෙම අධ්‍යයනය මගින් තහවුරු වුණි. ප්‍රමාණවත් ප්‍රාග්ධනය සහ අවශ්‍ය සම්පත් ලබා ගැනීමේ දී ශ්‍රී ලංකාවේ සුළු හා මධ්‍ය පරිමාණ ව්‍යවසායක අංශය මුහුණ දෙන සංරෝධක එහි දී ප්‍රධාන විය. ශ්‍රී ලංකාවේ සුළු හා මධ්‍ය පරිමාණ ව්‍යවාසයක අංශය මුහුණ පාන ගැටලු නිරාකරණය කර ගැනීම සඳහා රාජ්‍ය, පෞද්ගලික හා අදාළ ක්ෂේත්‍රයේ විශේෂඥයින්ගේ මැදිහත්වීම සහිත යාන්ත්‍රණයක් ගොඩනැගීම හරහා එම ව්‍යවසායකයන් මුහුණ පාන ගැටලු විසඳීමට ක්‍රියා කළ හැකිය. ශ්‍රී ලංකාවේ දරිද්‍රතාව පිටුදැකීමේ දී ග්‍රාමීය අංශයේ පුළුල් පරිවර්තනයක් (Inclusive Rural Poverty Transformation) ඉලක්ක වූ ග්‍රාමීය සංවර්ධන උපායමාර්ගයක් වශයෙන් සුළු හා මධ්‍ය පරිමාණ ව්‍යවසායන්හි විශේෂීකරණයක් හා විවිධාංගීකරණයක් ගොඩ නැගෙන පරිදි ප්‍රතිපත්ති සකස් කිරීම කෙරෙහි රජයේ වැඩි අවධානයක් යොමු විය යුතුය. ශ්‍රී ලංකාව විෂයයෙහි "සියලු ආකාරයේ දිළිඳුබව සියලු තැන්හිම දුරුකිරීම" යන කේන්ද්‍රිය තිරසර සංවර්ධන අභිමතාර්ථය අපේක්ෂිත කාල වකවානුවල දී සාධනය කර ගැනීමට එමගින් මහගු පිටුවහලක් සැපයෙනු ඇත.

විමර්ශන ග්‍රන්ථ නාමාවලිය

අතපත්තු, ඩී. (2018). *ආර්ථික විද්‍යාව හැඳින්වීමක් 2*, කර්තෘ ප්‍රකාශනයකි.

දිල්රුක්ෂිණී, ඩබ්. ඒ. (2004). ශ්‍රී ලංකාවේ සුළු හා මධ්‍ය පරිමාණ කර්මාන්ත; ගැටලු හා විසඳුම්, *සටහන, 23* (4-5), 17-18.

කටුකුරුන්ද, සරත් (2006). *ශ්‍රී ලංකාවේ ආර්ථික සංවර්ධනය සහ ග්‍රාමීය කාර්මීකරණය*, ග්‍රාමසංවර්ධන අභ්‍යාස හා පර්යේෂණ ආයතනය.

ශ්‍රී ලංකා මහ බැංකුව, (2018). *වාර්ෂික වාර්තාව -2018*, ශ්‍රී ලංකා මහ බැංකුව.

ශ්‍රී ලංකා මහ බැංකුව, (2015). *වාර්ෂික වාර්තාව -2015*, ශ්‍රී ලංකා මහ බැංකුව.

Addi, F. J. (2014). *Contribution of SMEs on Poverty Alleviation in Zanzibar: A Case of Small Scale Salt Production in Pemba Eastern Coast.* The Open University of Tanzania.

Adeusi, S., & Aluko, O. (2014). Assessing the Role of Government in Promoting Small Scale Businesses in KogiState: The Kabba/Bunu Experience. *IOSR Journal of Business and Management, 16*(11), 86-92.

Adeyemi, N. A., & Lanrewaju, N. M. (2014). Impact of Micro and Small Business Entrepreneurship on Poverty Reduction in Ibadan Metropolis, South Western Nigeria. *International Review of Management and Business Research, 3*(3), 1603-1626.

Agyapong, D. (2010). Micro, Small and Medium Enterprises' Activities, Income Level and Poverty Reduction in Ghana-A Synthesis of Related Literature. *International Journal of Business and Management*, *5*(12), 196-205.

Akugri, M., Bagah, D., & Wulifan, J. (2015). The Contributions of Small and Medium Scale Enterprises to Economic Growth: A Cross-Sectional Study of Zebilla in the Bawku West District of Northern Ghana. *European Journal of Business and Management, 7*(9), 262-274.

Ashrafi, R., & Murtaza, M. (2008). Use and Impact of ICT on SMEs in Oman. *Electronic Journal of Information Systems Evaluation*, *11*(3), 125-138.

Asian Development Bank. (2014). *Asia SME Finance Monitor 2013.* Asian Development Bank.

Asian Development Bank. (2019). *Effective Approaches to Poverty Reduction: Selected Cases From the Asian Development Bank.* Asian Development Bank.

Attanasio, O., & Székely, M. (1999). *An Asset-Based Approach to the Analysis of Poverty in Latin America.* Inter-American Development Bank.

Audretsch, D. B. (2002). The Dynamic Role of Small Firms: Evidence From the U.S. *Small Business Economics, 18*(1-3), 13-40.

Barbin, E. (2017). *The Dynamics of SME - Large Business Linkages: Findings from Six Cases.* Asian Institute of Management.

Beck, T., Demirgüç-Kunt, A., & Maksimovic, V. (2005). Financial and legal Constraints to Firm Growth: Does Firm Size Matter? *Journal of Finance, 60*, 137-177.

Bhaskaran, S. (2006). Incremental Innovation and Business Performance: Small and Medium-Size Food Enterprises in a Concentrated Industry Environment. *Journal of Small Business Management, 44*(1), 64-80.

Birch, D. L. (1979). *The Job Generation Process: Final Report to Economic Development.* Cambridge: MIT Program on Neighbourhood and Regional State.

Blomström, M., & Kokko, A. (1998). Multinational Corporations and Spillovers. *Journal of Economic Surveys, 12*(2), 1-31.

Bowale, E. (2013). Small and Medium Enterprises (SMEs) Development and Poverty Alleviation in Developing Countries: Evidence from Ekiti State, Nigeria. *Economic and Social Development. 2nd International Scientific Conference in Paris*, 1423-1437.

Central Bank of Sri Lanka. (1998). *Economic Progress of Independent Sri Lanka: 1948-1998.* Central Bank of Sri Lanka.

Chandak, A. (2018). The Impact of Supply Chain Strategy and Supply Chain Flexibility on the Performance of Small and Medium Enterprises(SME'S) In Indian Automobile Sector. *American Based Research Journal, 7*(9), 42-47.

Cook, P., & Nixson, F. (2005). Finance and Small and Medium-Sized Enterprise Development. In C. J. Green, C. H. Kirkpatrick, & V. Murinde, *Finance and Development: Surveys of Theory, Evidence and Policy*. Edward Elgar.

Daniels, L. (1999). The Role of Small Enterprises in the Household and National Economy in Kenya: A Significant Contribution or A Last Resort? *World Development, 27*(1), 55-65.

Dasanayaka, S. W., & Sardana, G. D. (2015). Development of Small and Medium Enterprises through Clusters and Networking: A Comparative Study of India, Pakistan and Sri Lanka. *International Journal in Economics and Business Administration, 3*(2), 84-108.

DCS. (2008). *Poverty Indicators: Department of Census and Statistics Household Income and Expenditure Survey–2006/07*. Ministry of Finance and Planning.

DCS. (2015a). *The Spatial Distribution of Poverty in Sri Lanka: Department of Census and Statistics Household Income and Expenditure Survey–2012/13*. Department of Census and Statistics.

DCS. (2015b). *Non-Agricultural Economic Activities in Sri Lanka Economic Census 2013/2014*. Department of Census and Statistics.

DCS. (2017). *Poverty Indicators: Department of Census and Statistics Household Income and Expenditure Survey–2016*. Ministry of National Policies and Economic Affairs.

DCS. (2019). *Global Multidimensional Poverty for Sri Lanka*. Ministry of Economic Reforms and Public Distribution.

de Kok, J., Deijl, C., & Van EssenIs, C. V. (2013). *Is Small Still Beautiful? Literature Review of Recent Empirical Evidence on the Contribution of SMEs to Employment Creation.* Deutsche Gesellschaft fur Internationale Zusammenarbeit(GIZ).

Department of Census and Statistics. (2011). *Poverty Indicators: Department of Census and Statistics Household Income and Expenditure Survey – 2009/10.* Ministry of National Policies and Economic Affairs.

DFID. (2000). *Eliminating World Poverty: Making Globalisation Work for the Poor.* London: The Department for International Development.

Diriba, S. (2013). Socio-Economic Contributions of Micro and Small Enterprises: The Case of Jimma City. *School of Plant Sciences, 2*(2), 123-134.

Ermias, E., Mekdim, D., Ibrahim, W. S., & Feiruz, Y. (2017). *The Role of Micro and Small Enterprises in Reducing Unemployment and Poverty in Ethiopia.* Partnership for Economic Policy.

Fafchamps, M., & Minten, B. (2002). Returns to Social Network Capital among Traders. *Oxford Economic Papers, 54*, 173. https://doi.org/10.1093/oep/54.2.173

Faki, A. J. (2014). *Contribution of SMEs on Poverty Alleviation in Zanzibar: a Case of Small Scale Salt Production in Pemba Eastern CoastA Dissertation Submitted in Partial Fulfillment of the Requirements for the Degree of Master of Business Administration.* Open University of Tanzania .

Foghani, Sara & Batiah Mahadi & Rosmini Omar, (2017). "Promoting Clusters and Networks for Small and Medium Enterprises to Economic Development in the Globalization Era," *SAGE Open, 7*(1), 1-9.

Frederick, O. A., Ahmed, A., & Kofi, P. (2017). Nexus Between Social Capital and Performance of Micro and Small Firms in An Emerging Economy: The Mediating Role of Innovation. *Cogent Business & Management, 4*(1), 1-20.

Gebremariam, G. H., Gebremedhin T. G., & Randall, W. (2004). The Role of Small Business in Economic Growth and Poverty Alleviation in West Virginia. *An Empirical Analysis Research Paper, 2004-10*.

Geremewe, Y. T. (2018). The Role of Micro and Small Enterprises for Poverty Alleviation. *International Journal of Research Studies in Agricultural Sciences, 4*(12), 38-47.

Glaeser, E. L. (1998). Are Cities Dying ? *Journal of Economic Perspectives, 12*(2), 139-160.

Goh, M. (2002). Issues Facing Asian SMEs and their Supply Chains. In M. Goh, *Asian Cases on Supply Chain Management for SMEs: Report of the Symposium on Supply Chain Management for Small and Medium Enterprises*. Asian Productivity Organization.

Green, C. J., Kimuyu, P., Manos, R., & Murinde, V. (2002). *How Do Small Firms in Developing Countries Raise Capital? Evidence from a Large-Scale Survey of Kenyan Micro and Small Scale Enterprises (MSES).* Institute for Development Policy and Management.

Grosh B, & Somolekae G. 1996. Mighty oaks from little acorns: can microenterprise serve as the seedbed of industrialization? *World Development, 24*(12), 1879–1890.

Hall, B., Lotti, F., & Mairesse, J. (2009). Innovation and Productivity in SMEs: Empirical Evidence for Italy. *Small Business Economics, 33*(1), 13-33.

Harper, M. (1984). *Small Businesses in the Third World*. John Wiley & Sons.

Harvie, C. (2010). SMEs and Regional Production Networks. In T. T. Vo, D. . Narjoko, & S. Oum, *Integrating Small and Medium Enterprises (SMEs) into the More Integrate East Asia*. ERIA.

Harvie, C. (2015). *SMEs, trade and development in South-east Asia.* International Trade Centre.

Imai, K., Arun, T., & Annim, S. (2010). Microfinance and Household Poverty Reduction: New Evidence from India. *World Development*, *38*(12), 1760-1774.

Intarakumnerd, P., & Goto, A. (2016). Technology and Innovation Policies for SMEs in East Asia. In V. Paul, C. Pornpinun, & Y. Naoyuki, *SMES in Developing Asia New Approaches to Overcoming Market Failures.* The Asian Development Bank Institute.

Islam, R. (2004). *The Nexus of Economic Growth, Employment and Poverty Reduction: An Empirical Analysis.* International Labour Office.

Javorcik, B. S. (2004). Does Foreign Direct Investment Increase the Productivity of Domestic Firms? ın Search of Spillovers Through Backward Linkages. *The American Economic Review*, *94*(3), 605-627.

Jayasekara, J. P., & Thilakarathna, A. (2013). *Government Policy and Strategy for SME Development.* Ministry of Finance and Planning.

Kirsten, J., & Sartorius, K. (2002). Linking Agribusiness and Small-Scale Farmers in Developing Countries: Is There a New Role for Contract Farming? *Development Southern Africa, 19*(4), 503-529.

Klein, M.U., & Hadjimichael, B. (2003). *The Private Sector in Developing Entrepreneurship, Regulation and Competitive Disciplines*, World Bank.

Kobia, M., & Sikalieh, D. (2010). Towards a Search for The Meaning of Entrepreneurship. *Journal of European Industrial Training, 34*(2), 110-127.

Koh, S. C. (2007). The Impact of Supply Chain Management Practices on Performance of SMEs. *Industrial Management & Data Systems, 107*(1), 103-124.

Kohona, N. B. (2002). Selected Country Papers- Sri Lanka. In M. Goh, *Asian Cases on Supply Chain Management for SMEs: Report of the Symposium on Supply Chain Management for Small and Medium Enterprises*.Asian Productivity Organization.

Kowo, S. A., Adenuga, O. A., & Sabitu, O. O. (2019). The Role of SMEs Development on Poverty Alleviation in Nigeria. *Insights into Regional Development, 1*(3), 214-226.

Lambert, D. M., & Schwieterman, M. A. (2012). Supplier Relationship Management as A Macro Business Process. *Supply Chain Management: An International Journal*, *17*(3), 337-352.

Li, S., Ragu-Nathan, B., Ragu-Nathan, T. S., & Rao, S. (2006). The Impact of Supply Chain Management Practices on Competitive Advantage and Organizational Performance. *Omega, 34*(2), 107-124.

Liedholm, C., Mcpherson, M., & Chuta, E. (1994). Small Enterprise Employment Growth in Rural Africa. *American Journal of Agricultural Economics, 76*(5), 1177-1182.

Loayza, N. V., & Raddatz, C. (2010). The Composition of Growth Matters for Poverty Alleviation. *Journal of Development Economics, 93*(1), 137-151.

Luetkenhorst, W. (2004). Corporate Social Responsibility and the Development Agenda: The Case for Actively Involving Small and Medium Enterprises. *Intereconomics, 39*(3), 157-166.

Manzoor, F., Longbao, W., Mohammad, N., & Qazi, A. S. (2019). Role of SME in Poverty Alleviation in SAARC Region Via Panel Data Analysis. *Sustainability, 11*(22), 1-14.

Markusen, J. R., & Venables, A. J. (1999). Foreign Direct Investment as A Catalyst for Industrial Development. *European Economic Review, 43*(2), 335-356.

McDade, B., & Spring, A. (2005). The New Generation of African Entrepreneurs: Networking to Change the Climate for Business and Private Sector Led Development. *Entrepreneurship and Regional Development, 17*(1), 17-42.

McPherson, M. A. (1996). Growth of Micro and Small Enterprises in Southern Africa. *Journal of Development Economics, 48*(2), 253-277.

Ministry of Industry and Commerce (MIC). (2016). *National Policy Framework for Small & Medium Enterprise (SME) Development*. Ministry of Industry and Commerce.

Mukras, S. M. (2003). Poverty Reduction Through the Strengthening of Small and Medium Enterprises. *Journal of African Studies, 17*(2), 58-67.

Musara, M., & Gwaindepi, C. (2014). Factors within the Business Regulatory Environment Affecting Entrepreneurial Activity in South Africa. *Mediterranean Journal of Social Sciences, 5*(6), 109-116.

Muturi, P. M. (2015). The Role of Micro and Small Enterprises (MSEs) in Achieving Kenya Vision 2030. *International Journal of Economics, Commerce and Management, 3*(5), 1337-1352.

Naude, P., Zaefarian, G., Tavani, Z. N., Neghabic, S., & Zaefarianc, R. (2014). The Influence of Network Effects on SME Performance. *Industrial Marketing Management, 43*(4), 630-641.

Nishantha B. and Padmasiri H. M. N.(2010). Development of Small and Medium Enterprises in Post Conflict Sri lanka: Opportunities, Challenges and Policy Implications. *Ryukoku Journal of Economic Studies, 49*(4), 41-54.

Nursini, N. (2020). Micro, Small, and Medium Enterprises (MSMEs) and Poverty Reduction: Empirical Evidence from Indonesia. *Development Studies Research, 7*(1), 153-166.

Nursini, N., & Tawakkal, T. (2019). Poverty Alleviation in the Contex of Fiscal Decentralization in Indonesia. *Economics & Sociology , 12*(1), 270-285.

Oduntan, K. O. (2014). The Role of Small and Medium Enterprises in Economic Development: The Nigerian Experience. *International Conference on Arts, Economics and Management (ICAEM'14) March 22-23, 2014 Dubai (UAE)*, ICAEM.

OECD. (2009). *The Impact of the Global Crisis on SME and Entrepreneurship Financing and Policy Responses.* Centre for Entrepreneurship, SMEs and Local Development.

Olawale, F., & Garwe, D. (2010). Obstacles to the Growth of New SMEs in South Africa: A principal Component Analysis Approach. *African Journal of Business Management, 4*(5), 729-738.

Oluwafemi, O. S. (2015). *The Impact of Information Communication Technology on Small and Medium Scale Enterprise Productivity in Nigeria.* Vaasa University of Appiled Science.

Pack, H., & Saggi, K. (2001). Vertical Technology Transfer via International Outsourcing. *Journal of Development Economics, 65*(2), 389-415.

Premaratne, S. P. (2001). Networks, Resources, and Small Business Growth: The Experience in Sri Lanka. *Journal of Small Business Management, 39*(4), 363-371.

Rezaei, J., Roland, O., & Paul, T. (2015). How SMEs Can Benefit from Supply Chain Partnerships. *International Journal of Production Research*, *53*(5*)*, 1527-1543.

Sen, A. (1980). Labor and Technology. In J. Cody, H. Hughes, & D. Wall, (Eds.) *Policies for Industrial Progress in Developing Countries.* Oxford University Press.

Sharafat, A. H., & Muhammad, A. K. (2014). The Role of Small and Medium Enterprises and Poverty in Pakistan: An Empirical Analysis. *Theoretical and Applied Economics, XXI 4*(593), 67-80.

Shariff, M. M., Peou, C., & Ali, J. (2010). Moderating Effect of Government Policy on Entrepreneurship and Growth Performance of Small-Medium Enterprises in Cambodia. *International Journal of Business and Management Science, 3*(1), 51-58.

Shaw, E., & Conway, S. (2000). Networking and the Small Firm. In S. C. Evans (Eds.) *Enterprise and Small Business.* Prentice Hall.

Small Enterprises Assistance Funds (SEAF). (2004). *The Development Impact of Small and Medium Enterprises: Lessons Learned from SEAF Investments.* SEAF.

SME Task Force. (2002). *National Strategy for the SME Sector in Sri Lanka, White Paper*. Small and Medium Enterprise Sector Development Program.

So, S., & Sun, H. (2010). Supplier Integration Strategy for Lean Manufacturing Adoption in Electronic enabled Supply Chains. *Supply Chain Management: An International Journal*, *15*(6), 474-487.

Tan, K. C. (2002). Supply Chain Management: Practices, Concerns, and Performance Issues. *Journal of Supply Chain Management, 38*(1), 42-53.

Thrikawala, S. S. (2011). Impact of Strategic Networks for the Success of SMEs in Sri Lanka. *World Journal of Social Sciences, 1*(2), 108-119.

Tülücea, N. S., & Doğanb, İ. (2014). The Impact of Foreign Direct Investments on SMEs' Development. *Procedia - Social and Behavioral Sciences, 150*(2014), 107-115.

UNDP & UNIDO. (2004). *Partnerships for Small Enterprise Development.* Deloitte.

UNIDO. (2001). *Development of Clusters and Networks of SMEs.* The UNIDO Programme.

United Nations. (2011). *Enabling Environment for the Successful Integration of Small and Medium-Sized Enterprises in Global Value Chains: Country Studies on Bangladesh, Nepal and Sri Lanka.* United Nations Publication.

United Nations Industrial Development Organization (UNIDO). (2004). *Inserting Local Industries into Global Value Chains and Global Production Networks: Opportunities and Challenges for Upgrading.* United Nations Industrial Development Organization.

Villanger, E., & Berge, L. I. (2015). *Private Sector Development for Poverty Reduction: Opportunities and Challenges for Norwegian Development Aid.* Chr. Michelsen Institute.

Wickremasinghe, S. I. (2011). *The Status of SMEs in Sri Lanka and Promotion of Their Innovation Output.* National Science Foundation.

World Bank (WB), 2015. *Sri Lanka Ending Poverty and Promoting Shared Prosperity*. the International Bank for Reconstruction and Development.

Zafar, M., Muhammad, W., & Muhammad, N. B. (2018). The Role of Small and Medium Enterprises on Poverty Reduction in Developing Country: A Case of Pakistan. *Pakistan Business Review, 20*(3), 703-713.

Zeng, S. X., Xie, X. M. & Tam, C. M. (2010), "Relationship between Cooperation Networks and Innovation Performance of SMEs", *Technovation, 30*(3), 181-194.